Berghof
Research Center
Forschungszentrum
for Constructive
für konstruktive
Conflict Management
Konfliktbearbeitung

# සාම සහ ගැටුම් බලපෑම් ඇගැයීමේ ක්‍රමවේදය

මාර්ක් හොෆ්මන් (Mark Hoffman)

www.berghof-handbook.net



1. හැඳින්වීම 218
2. සාම්ප්‍රදායික ආධාරක ඇගැයීම 221
3. සංවර්ධන ව්‍යාපෘති, ගැටුම් සහ සා. ගැ. බ. ඇ. 225
4. සා. ගැ. බ.ඇගැයීම් රාමු ඒකාබද්ධ කිරීම 232
5. සා. ගැ. බ. ඇ. සාම වෘත්තිකයා දෘෂ්ටියක් 235
6. සා. ගැ. බ. ඇ. සංවාද සාරාංශ, ප්‍රශ්න උපකල්පනයන් සහ ඉදිරි මාර්ග 240
7. ආශ්‍රිත ලේඛන සහ වැඩිදුර කියවීම 242

©2006 Berghof Research Center for Constructive Conflict **Management**

# සාම සහ ගැටුම් බලපෑම් ඇගැයීමේ ක්‍රමවේදය

මාර්ක් හොෆ්මන් (Mark Hoffman)

## 1. හැඳින්වීම

සීතල යුද්ධයේ අවසානයේ පටන් ජාත්‍යන්තර ප්‍රජාව ක්‍රියාකාරී ගැටුම් අවස්ථා ගණනාවකට මුහුණ දෙමින් සිටී. මේවාට: සීතල යුද්ධය සහිත ජාත්‍යන්තර ක්‍රමය අභාවයට යාමට පෙර පැවති දිග්ගැසුණු ගැටුම් මාලාවක් (ශ්‍රී ලංකාව, කාශ්මීරය, උතුරු අයර්ලන්තය, සයිප්‍රසය සහ මැද පෙරදිග); පශ්චාත් සෝවියට් සාංක්‍රමික ගැටුම් (නගෝර්නො කරබාහ්, ජෝර්ජියා/ අබ්ගාසියා, මෝල්ඩෝවා/ ට්‍රාන්ස්ඩ්නීස්ට්‍රියා); අවසානයේදී අති භයංකර පවිත්‍රකරණයක් (බෝල්කන් රටවල්) හෝ සමූහ ඝාතන (රුවන්ඩාව) ඇති කළ ප්‍රචණ්ඩ ගැටුම්; සංකීර්ණ හදිසි තත්ත්වයන් (සූඩානය, රුවන්ඩාව); සහ අවසාන වශයෙන් පැහැදිලි දේශපාලන අරමුණුවලට ප්‍රචණ්ඩත්වයේ දේශපාලන ආර්ථිකයක් එක් වූ තත්ත්වයක් (ලයිබීරියාව, සියරා ලියෝන්, ඇන්ගෝලාව) ඇතුළත් වී ඇත. මීට අමතරව ගැටුමට නැඹුරුවීමේ ලක්ෂණ පෙන්වන හෝ පෘෂ්ඨයට යටින් ප්‍රචණ්ඩ ගැටුම් විභවයන් පවතින තත්ත්වයන් ගණනාවක් ඇත.

මෙම ගැටුම් තත්ත්වයන් සහ ඒවාට ප්‍රතිචාර දක්වන බවක් පෙන්වීමේ අවශ්‍යතාව දැන් ජාත්‍යන්තර න්‍යාය පත්‍රයේ කේන්ද්‍රීය ස්ථානයක් දරයි (Carnegie 1997). මේ ප්‍රතිචාරයන් කෙටි කාලීන මානුෂීය ආධාරවල සිට දීර්ඝ කාලීන සහ සාම්ප්‍රදායික සංවර්ධන වැඩසටහන් සැකසීම දක්වාද, යහපත් පාලනය සහ සිවිල් සමාජයේ විවිධ වූ හැකියාවන් වර්ධනය කිරීම, ප්‍රවර්ධනය කිරීම ඉලක්ක කරගත් ව්‍යාපෘති දක්වාද පැතිර පවතී. පසුගිය පස් වසර පුරා, එවැනි යත්නවලට ආධාර පිණිස සැලකිය යුතු හා වර්ධනය වන ද්විපාර්ශ්වික හා බහු පාර්ශ්වික අරමුදල් ප්‍රමාණයක් රාජ්‍ය නොවන සංවිධාන මගින් යවනු ලැබ තිබේ. මෙම මුදල්වලින් වැඩි ප්‍රමාණයක් සංවර්ධන හා මානුෂීය රාජ්‍ය නොවන සංවිධානවලට ගලා ගියද, නිශ්චිත ගැටුම් නිරාකරණයේ සහ සාමය ගොඩනැගීමේ වරමක් සහිත ව්‍යාපෘතිවලට සහ/ හෝ රාජ්‍ය නොවන සංවිධාන වෙතට ගලා යන මුදල් ප්‍රමාණයේ වැඩිවීමක් ඇත.



ගැටුම් ගතිකත්වය, සංවර්ධනය සහ මානුෂීය සහන සැලසීම සහ තිරසාර සාමයක් සඳහා වූ අපේක්ෂා අතර සංකීර්ණ අන්තර් සම්බන්ධතාව මත පදනම් වූ 'එකට යා කරන ලද' ඒකාබද්ධ ප්‍රතිචාරයන් වැඩි දියුණු කිරීමේ අවශ්‍යතාව පිළිගැනීමෙන් මෙය සිදු වී තිබේ. සංවර්ධන හා මානුෂීය ආයතන පටු තාක්ෂණික වරමෙන් ඔබ්බට ගොස් සිතීමේ සහ ක්‍රියා කිරීමේ අවශ්‍යතාව වැඩි වැඩියෙන් පිළිගෙන ඇත. අඩු තරමින් බොහෝ දෙනෙකු දැන් 'හානි නොකරව්' යන ආස්ථානය යොදාගෙන තිබේ (Anderson, 1999).

ආධාර දෙන රටවල් ගණනාවක් (විශේෂයෙන්ම ස්වීඩනය, කැනඩාව, නෝර්වේ සහ එක්සත් රාජධානියා) සහ රාජ්‍ය නොවන සංවිධාන (කෙයාර්, ඔක්ස්ෆෑම් සහ සේව් ද චිල්ඩ්‍රන් ෆන්ඩ්) ගණනාවක් මෙම අවමවාදී චින්තන රටාවෙන් ඉවතට යන්නට පටන් ගෙන, ඒ වෙනුවට වඩාත් සමස්ත ප්‍රවේශයක් ගනිමින් සිටී. මෙම ප්‍රයත්නයන් වඩාත් යොමු කරනු ලැබ ඇත්තේ මානුෂීය ආධාර, දිළිඳුකම දුරලීම සහ

තිරසාර සංවර්ධනය වැනි සාම්ප්‍රදායික නිර්දේශ අනුව ප්‍රධාන ප්‍රවාහයේ සාමය ගොඩනැගුම ඉලක්ක කොට ගෙනය. සංකල්ප, අදහස් හා භාවිතයෙන් මානුෂීය ආධාර, ගැටුම් විසඳීම සහ සාමය ගොඩනැගීම යන සාම්ප්‍රදායික ක්ෂේත්‍ර අතර කලෙක පැවති පැහැදිලි මායිම් හරහා වැඩි වැඩියෙන් සංක්‍රමණය වෙමින් පවතී.

කෙසේ වෙතත්, මෙම ප්‍රතිචාරයන්ගේ අන්තර්ගතය ගැටලු සහගත නොවී තිබුණේ නැත. ඇන්ඩර්සන් (1999) ස්මීලී (1998) සහ අනෙකුත් අයවලුන් දක් වූ පරිදි, මෙම වැඩසටහන් සහ ව්‍යාපෘති හා ඒවා ක්‍රියාත්මක කෙරෙන ආකාරය, කල්පවත්නා සංවර්ධනය සහ සාමය සඳහා වූ අවස්ථාවන් වර්ධනය කළ තරමටම, ඒවායේ ස්වභාවය නිතරම ගැටුම් ගතිකත්වය අවුලුවා ඇත. ඒ අනුව, අරමුදල් යෙදවුණු ව්‍යාපෘතිවල සංඛ්‍යාව සහ පරිමාණය මෙන්ම මුදල් යෙදවූ මට්ටම සලකා බලන කල, එවැනි ව්‍යාපෘතිවල බලපෑම ඇගැයීමෙහි විචාරවත් උනන්දුවක් වර්ධනයවීම පුදුමයට කරුණක් නොවේ. උගත් පාඩම් හඳුනාගැනීමේ දී සහ හොඳ චර්යාවන් වර්ධනය කර ගැනීමේදී මෙම ප්‍රයත්නයන් තනි තනි වැඩසටහන්වල හැඩය හෝ ආධාරකරුවන් (ඩෙන්මාර්ක් ජාත්‍යන්තර සංවර්ධනය සහය (DANIDA) සහ ස්වීඩන් ජාත්‍යන්තර සංවර්ධන සහයෝගීතා ආයතනය (SIDA) බලන්න) මගින් හා තනි අර්බුද තත්ත්වයකට ලැබෙන පුළුල් පරාසයක ප්‍රතිචාරයන් පිළිබඳ වූ බහු ආධාරකාර අගැයීම් මගින් කෙරෙන ව්‍යාපෘති අගැයීම්වල හැඩය හෝ ගෙන ඇත (Borton et al. 1996, Lautze et al. 1998).

එවැනි අගැයීම්වල සංඛ්‍යාව වැඩිවෙමින් පවතින අතර, ඒවායේ ගුණාත්මක භාවය, පරාසය, ගැඹුර සහ ක්‍රමවේදය සැලකිය යුතු තරමින් වෙනස් වෙමින් පවතී. නීල්ස් ඩේබල්ස්ටේන් මෙම තත්ත්වය 'ක්‍රමවේදී අරාජකත්වය' ක් ලෙස විස්තර කොට ඇත (Organization for Economic Coorperation and Development 1999). "ඓතිහාසික වශයෙන්, සංවර්ධන ආධාරවලට වඩා මානුෂීය ආධාර දැඩි බවෙන් සහ පුළුල් බවෙන් අඩු අධීක්ෂණ අගැයීම් පිළිවෙත්වලට යටත් කරනු ලැබ තිබේ" (OECD 1992, 2) යනුවෙන් සඳහන් කරයි. ගැටුම් නිරාකරණය කිරීමේ සහ සාමය ගොඩනැගීමේ කටයුතු අගැයීම් ඊටත් වඩා පසුපසින් ඇතැයි කෙනෙකුට මීට තව කරුණක් එක් කළ හැකිය. සාමය ගොඩනැගීමේ යෙදී සිටින වෘත්තිකයන් හෝ සංවිධාන ඒවා ගැන කරදර වන්නට පවා පටන් ගත්තේ සාපේක්ෂ වශයෙන් මෑතක සිටය. එවැනි අගැයීම් අදාළ නොවන්නක් හෝ අත්‍යවශ්‍ය බරක් ලෙස නිතරම සැලකූ අය ඒවා තමනට ආධාර දෙන්නන් තෘප්තිමත් කරන්නට පමණක් හෝ අනවබෝධයෙන් යුත් බාහිර උපදේශකයින්ට නුසුදුසු අවමානකාරී විනිශ්චයන්හි යෙදෙන්නට දිරිදෙන භයානක ක්‍රියාමාලාවක් ලෙස පවා සලකා කටයුතු කළහ.



**කොටුව 1 වත්මන් සා. ගැ. බ. අ. (PCIA) ව්‍යාපෘති මෙම ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා දායක වන්නන් අතර සිටින ආයතන**

- එතෙර සංවර්ධන ආයතනයේ (එ. රා.) පිහිටුවනු ලැබ ඇති; මානුෂීය කටයුතුවලදී විශ්වසනීයත්වය සහ ක්‍රියාශීලීත්වය සඳහා වූ ක්‍රියාකාරී අධ්‍යයන ජාලය (ALNAP);
- ක්ලින්ජෙන්ඩේල් ආයතනය (නෙදර්ලන්තය)
- ඉන්ටර්නැෂනල් ඇලර්ට් සංවිධානය - (ජාත්‍යන්තර සෝදිසි-UK)

- ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ අංශය (DFID)/ INTRAC (UK);
- මේරි ඇන්ඩර්සන්ගේ සහයෝගීතා හා සංවර්ධනය සඳහා වූ සංවිධානය- (කේම්බ්‍රිජ්, එක්සත් ජනපදය) 'සාම භාවිතය පිළිබඳ විචින්තනය'-මෙය 'කැපසිටීස් ෆෝ පීස්' ආයතනය වෙනුවට බිහිවුවකි.
- ජාත්‍යන්තර සංවර්ධන පර්යෙෂණ කේන්ද්‍රය (IDRC) කැනඩාව.
- ගැටුම් නිවාරණය හා ව්‍යාවර්තනය සඳහා වූ යුරෝපීය වේදිකාව (නෙදර්ලන්තය)
- ආර්ථික සහයෝගීතාව හා සංවර්ධනය සඳහා සංවිධානය (OECD) සංවර්ධන සහායක කමිටුව

එසේ වුවද, ගැටුම් නිරාකරණය සහ සාමය ගොඩනැගීම අරමුණු කරගත් මැදිහත්වීම් හා එවැනි ක්‍රියාමාර්ගවල නිරත වන රාජ්‍ය නොවන සංවිධානවල සංඛ්‍යාව වැඩිවත්ම, ඒවා යහපත් ප්‍රතිඵල ලබා දෙන්නේ ද නැද්ද යන්න දැන ගැනීමේ උනන්දුව ද වැඩි විය හැකිය. එවැනි ක්‍රියාමාර්ග පිළිබඳ සැලකිය යුතු තරම් කතා පුවත් තිබෙන අතර, මෙම ක්‍රියාමාර්ගවල බලපෑම පිළිබඳව දැනුමේ ක්‍රමානුකූල වර්ධනය හා ඒකරාශීවීම දකින්නට අප මේ පටන් ගත්තා පමණි (කොටුව 1 බලන්න).

සුදුසු ඇගැයීම් ක්‍රමවේද සකස් කරගත යුත්තේ ආධාර දෙන්නන්, වෘත්තිකයින් සහ අවසාන එල ලබන්නන් ආදීන්ගේ යහපත පිණිසය. ඒ ක්‍රමවේද නම් ගැටුම් විසඳීමේ සහ සාමය ගොඩනැගීමේ බොහෝ ක්‍රියාමාර්ගවල සංකීර්ණ, බහු ක්‍රියාකාරී, අතිශයින් අන්තර් සම්බන්ධිත ස්වභාවය ඇතුළත් කරගත හැකි ශිල්ප ක්‍රමයන්ය. එවැනි ක්‍රමවේද සකස් කිරීමේ දී අප පහත සඳහන් ප්‍රශ්න මතු කළ යුතුය.

220


මෙම මැදිහත්වීම්වල අපේක්ෂිත ප්‍රතිඵල මොනවා ද? ඒවා සාර්ථක වී ද? එසේ වූයේ කුමන කොන්දේසි හෝ තත්ත්වයන් යටතේ ද? ඒවා අසාර්ථක වී නම් නැතහොත් අනපේක්ෂිත ප්‍රතිවිරුද්ධ ප්‍රතිඵල ගෙන දුන්නේ නම් ඒ මන්ද? එවැනි ඇගැයීමකදී ඵලදායී ලෙස යොදාගත හැකි නිර්ණායක, ප්‍රමිතීන් සහ දර්ශක මොනවාද? අපේක්ෂිත ප්‍රතිඵලවල බෝහෝ විට අපැහැදිලි ස්වභාවය අනුව, ඇගැයීම් කළ හැකි වන්නේ කෙසේද?

මෙම පරිච්ඡේදයේ අරමුණ වන්නේ 'සාමයේ සහ ගැටුම් බලපෑම් ඇගැයීමේ' (PCIA) ක්‍රමවේද සකස් කිරීම සඳහා වූ සමහර වත්මන් ක්‍රියාමාර්ගවල හා ප්‍රවේශයන්හි ජායාමාත්‍ර චිත්‍රයක් ඉදිරිපත් කිරීමයි. එය සා. ගැ.බ. අ. වෙතට වූ ප්‍රවේශ තුනක දළ විග්‍රහයක් සපයනු ඇත: ඒවා නම්, පිළිගත් ආධාර දෙන්නන්ගේ ඇගැයීමේ නිර්ණායය යොදාගන්නා ප්‍රවේශයන්; බහුවිධ වරමලත් සංවිධාන විසින් කරනු ලබන සංවර්ධනය සහ මානුෂීය වැඩසටහන් කෙරෙහි සාමය සහ ගැටුම ඇති කරන බලපෑම් ඇගැයීම සඳහා වූ ක්‍රමවේද සකස් කරන ප්‍රවේශ; සහ නිශ්චිත ගැටුම් විසඳීමේ සහ සාමය ගොඩනැගීමේ ඉලක්ක සහිතව රාජ්‍ය නොවන සංවිධාන කරන මැදිහත්වීම් කෙරෙහි නිශ්චිතවම අවධානය යොමු කරන ප්‍රවේශ යන්නයි. මේවා ඒකාබද්ධ ක්‍රියාත්මක ක්‍රමවේදයක් බවට සමායෝග කරගැනීමේ දී ඇතිවන ප්‍රශ්න සහ අපේක්ෂා පිළිබඳව යම් යම් අදහස් ඉදිරිපත් කරමින් මෙම පරිච්ඡේදය අවසන් වේ.

## 2. සාම්ප්‍රදායික ආධාරක ඇගැයීම

ඇගැයීම පිළිබඳ ආධාර දෙන්නන්ගේ ප්‍රධාන ප්‍රවේශය වන්නේ ව්‍යාපෘති චක්‍ර කළමනාකරණයයි (PCM). මෙම පදයේ විස්තර සහ වෙනස්කම් ආධාර දෙන ආයතනයෙන් ආයතනයට වෙනස්වන අතර, PCM සැමවිටම එකම මූලික සංඝටක ඇතුළත් කර ගනී: ව්‍යාපෘති හඳුනාගැනීම සහ සැලසුම් කිරීම, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ ව්‍යාපෘති අගැයීම ඒවායි. මේවා නිතරම අන්තර්-ගර්භ ප්‍රතිපෝෂණ පුඩුවක් සහිත ගතික, අන්තර්-ක්‍රියාකාරී සබඳතාවකින් නියෝජනය කෙරේ.

රූප සටහන 1 ව්‍යාපෘති චක්‍රය






එවැනි අගැයීමක ස්වභාවය සහ අරමුණ වන්නේ; "පිළියම් වශයෙන් ගත හැකි ක්‍රියාමාර්ග හා / හෝ අනාගතයේදී මේ හා සමාන ව්‍යාපෘතිවලට මඟ පෙන්වීම සඳහා වූ නිර්දේශ සැකසීම අරමුණු කරගෙන, ව්‍යාපෘති කාලයේ දී හෝ ඉන් අනතුරුව ව්‍යාපෘතියේ ප්‍රතිඵල සහ බලපෑම් විශ්ලේෂණය කිරීමය" (European Commission 1993,12).

එහෙත් යථාර්ථය මීට වඩා සෘජුය. නිතරම ඇගැයීම් කෙරෙන්නේ ව්‍යාපෘති චක්‍රයේ අවසානයේ දීය. වඩා කල්පනාකාරී ක්‍රියාත්මක කිරීම්වල දී සහ ආධාර දෙන ආයතනවල දී, මෙම අගැයීම්වල සංගෘහිත ස්වභාවය ක්‍රියාත්මක අධීක්ෂණයට මගපෑදීමට හෝ සමස්ත වැඩසටහන්වල මාර්ගෝපදේශ තුළට කා වැදීමට හෝ පුළුවන. එහෙත් නිතරම ආයතනික භාවිතාවන් උගත් පාඩම් හුවමාරු කිරීම වළක්වන අතර, සමාන හෝ සම්බන්ධිත ව්‍යාපෘතියක ඇගැයීමෙන් දැනුම ලබාගන්නේ කලාතුරකිනි. ඇගැයීම්වල පසු- ක්‍රියාමාර්ග ආයතනගත කිරීම සම්බන්ධයෙන් වැදගත් ප්‍රයත්නයක් නම් ඒකාබද්ධ ඇගැයීම් පසු ක්‍රියාමාර්ග අධීක්ෂණය සහ පහසුකම් සැලසීමේ ජාලය (JEFF) යි. වාර්තාවේ නිර්දේශ බැරෑරුම් ලෙස සලකා ඒ අනුව කටයුතු කෙරෙනු ඇතැයි යන්න සහතික කිරීමේ අරමුණින් රුවණ්ඩා ඒකාබද්ධ අගැයීමෙන් අනතුරුව මෙය ස්ථාපිත කෙරිණි. තවත් නිදර්ශනයක් නම් ඔපරේෂන් ලයිෆ්ලයින් සූඩාන් කොන්සෝටියම් යන ආයතනය මගින් කෙරෙන ත්‍රෛමාසික අධීක්ෂණයයි (OECD 1999, 77 බලන්න).

බොහෝ ආධාර දෙන ආයතන තමන්ගේම වූ අභ්‍යන්තර ඇගයුම් ඒකක පවත්වා ගෙන යන අතර, ඔවුන් විසින් බාහිර උපදේශකයින් මෙම කාර්යය සඳහා යොදාගැනීම නිතර සිදුවන්නකි. ඇත්ත

වශයෙන්ම ආධාර දෙන්නන් විසින් මෙහෙයවනු ලබන මෙම ඉල්ලුමට ප්‍රතිචාර වශයෙන් වෘත්තිය තක්සේරුකරුවන්ගේ කුඩා පරිමාණයේ කර්මාන්තයක් දූන් පැන නැගී ඇත. කාලයත් සමග මෙම වෘත්තිය තක්සේරුකරුවන්ගේ හොඳම භාවිතාවන් ප්‍රමිතිගත ක්‍රමවේදයක් සහ නිර්ණායක පද්ධතියක් කරා යොමුවන්නක් බවට ඒකාබද්ධවීමට පටන්ගෙන ඇත. DANIDA සහ SIDA ඇගැයීම් ගණනාවක් මෙන් ම OECD හි සංවර්ධන සහායක කමිටුවේ (OECD/ DAC) මාර්ගෝපදේශ පදනම් කරගෙන බොහෝ විට යොදාගන්නා ලද නිර්ණකයන් වන්නේ:

## 1. බලපෑම සහ ආවරණය

මෙය ව්‍යාපෘති ක්‍රියාමාර්ගවල ප්‍රතිඵල වන කල්පවත්නා වෙනස්කම් මැන බලයි. එහි ප්‍රශ්නයක් නගයි: ක්‍රියාමාර්ගය කුමන සැබෑ වෙනසක්, කා සඳහා කර තිබේද යන ප්‍රශ්නයට එය පිළිතුරු සපයයි. බලපෑම් ධනාත්මක හෝ සෘණාත්මක විය හැකිය; අපේක්ෂිත හෝ අනපේක්ෂිත විය හැකිය; ක්ෂණික හෝ දීර්ඝ කාලීන විය හැකිය; එසේම එය සූක්ෂම (උපරිම) හෝ මධ්‍යම හෝ සාර්ව (අවම) මට්ටමෙන් සිදුවිය හැකිය. ආවරණය යන්නෙන් හැඳින්වෙන්නේ විශේෂිත කොටස් (උදා: සමාජ, ආර්ථික, දේශපාලන සහ පාරිසරික) සහ/හෝ ඉලක්ක කණ්ඩායම් (උදා: පුද්ගලයන්, වැඩිහිටියන්, ළමයින්, කාන්තාවන් හෝ ප්‍රජාවන් සහ ආයතන සහ විශේෂිත සමාජ කණ්ඩායම්) හරහා දක්නට ලැබිය හැකි බලපෑම්වල වෙනස්වීමේ ස්වභාවයයි.



## 2. අදාළත්වය සහ අනුරූපතාව

පළමු නිර්ණායකය, ව්‍යාපෘතියක සමස්ත ඉලක්කය සහ අභිප්‍රාය කොතරම් දුරට ප්‍රතිපත්තිමය අවශ්‍යතා සහ ප්‍රමුඛතාවනට අනුරූප වන්නේ ද යන්න තක්සේරු කරයි. දෙවැන්න, ව්‍යාපෘති ක්‍රියාමාර්ග නිසි පරිදි දේශීය අවශ්‍යතා සමග බද්ධ කොට ඇත්දැයි තක්සේරු කරමින් ක්‍රියාමාර්ග සහ යෙදවුම් මට්ටම කෙරෙහි වැඩි අවධානයක් යොමු කරයි. මෙම වෙනස සමස්ත වැඩසටහනේ හෝ ව්‍යාපෘතියේ අරමුණු සඳහා අදාළ විය හැකි වුවත්, අනුගමනය කරන ලද විශේෂිත ක්‍රියාමාර්ග හෝ ව්‍යාපෘති මනාව නොගැළපේ යයි ද, වඩා හොඳ විකල්පයන් හඳුනා ගැනීමට හැකිව තිබුණි, නැත්නම් හඳුනාගත යුතුව තිබිණියි ද නිගමනය කිරීම් වශයෙන් අගැයීමකට ඉඩ සලසයි.

## 3. ඵලදායක බව සහ කාර්යක්ෂමතාව

මෙය ලබාගත් ප්‍රතිඵල සැබවින්ම අපේක්ෂිත වූ ප්‍රතිඵල ද, දෙන ලද සම්පත් මට්ටම තුළ උපරිම ප්‍රතිඵල ලබාගත්තේ ද යන්න මැන බලයි. මෙය වෙනස් වූ යෙදවුමක් භාවිත කිරීම මගින් මේ හා සමාන හෝ මීට වඩා හොඳ ප්‍රතිඵල ලබාගත හැකිව තිබුණේදැයි විනිශ්චය කිරීමට ඉඩ දෙයි.

## 4. කාලීන බව

මේ වඩාත් සුදුසු සහ ගැළපෙන මොහොතේ අනුගමනය කරන ලද ක්‍රියාමාර්ගයි.

## 5. කල්පවත්නා බව (තිරසාර බව)

මෙය ආධාර දෙන්නන් අරමුදල් සැපයීම නැවැත් වූ පසු ව්‍යාපෘතියක බලපෑම තවදුරටත් පැවතීමේ ප්‍රමාණය මැන බලයි. එය ව්‍යාපෘතිය කෙරෙහි දීර්ඝකාලීන අවධානයක් යොමු කරවයි, එසේම දේශීය බල ව්‍යූහ ගතිකත්ව සහ සමාජ ප්‍රාග්ධනය මතට එල්ල විය හැකි බලපෑම උළුප්පා දක්වයි. තවද බාහිර ක්‍රියාධරයින් සහ අභ්‍යන්තර ව්‍යූහ, ක්‍රියාවලීන් හෝ සංවිධාන (අරමුදල්, සම්පත්, අදහස් හෝ ක්‍රියාවලීන් යන අර්ථයෙන්) මත රඳා පවතින තත්ත්වයක් ඇති කිරීම සම්බන්ධයෙන් අවදියෙන් සිටීමේ අවශ්‍යතාව අවධාරණය කරයි (Ebata 1999).

## 6. සංගත බව, සම්බන්ධීකරණය සහ අනුපූරකත්වය

මෙහි දී වැඩසටහන්, ව්‍යාපෘති හෝ ක්‍රියාමාර්ගවල පරමාර්ථ එකිනෙකට හරස්වීම හෝ එකිනෙක අභිබවා යාම වෙනුවට එකිනෙක ශක්තිමත් කිරීම සහතික කළ හැකි ආකාරයට, එම වැඩසටහන්, ව්‍යාපෘති හෝ ක්‍රියාමාර්ග සැලසුම් කොට ක්‍රියාත්මක කොට ඇති ප්‍රමාණය එම ඇගැයීම මගින් තක්සේරු කෙරේ.

මේ එක් එක් ක්ෂේත්‍රවල සිය ඇගැයීම් පිළියෙල කිරීමේදී ඇගැයීම් කරන්නන් ව්‍යාපෘතිය වෙනුවට 'ලීස්තරය' වෙතට යොමු විය හැකිය. මෙය ඔවුනට වැඩසටහන සඳහා සමස්ත මූලකාරණය සහ නිශ්චිත ව්‍යාපෘතිය සඳහා අපේක්ෂිත ප්‍රතිඵලද, මෙම ප්‍රතිඵල අත්කර ගැනීමේ ක්‍රියාමාර්ග ද, මෙම ක්‍රියාමාර්ග සඳහා අවශ්‍ය කරන මානුෂීය හා සම්පත් යෙදවුම් සහ අපේක්ෂිත ප්‍රතිඵල කරා යාමේ ප්‍රගතිය 'නිරීක්ෂණය කටහැකි නිර්වද්‍යතා දර්ශකයන්' (OVIs) ද ලබාදෙයි. මෙම ලීස්තරය ව්‍යාපෘතියේ පාලනයෙන් පිටස්තරව ඇති බාහිරාංග වෙතින් ව්‍යාපෘතියට එල්ල වන අනතුරු ද හඳුනා ගනියි. ඉහත සඳහන් නිර්ණායකයන්ට ඉතා පැහැදිලි සබඳතා ඇත.

බලපෑම් තක්සේරුවේ දී විශේෂයෙන්ම වැදගත් වන්නේ 'නිරීක්ෂණය කටහැකි නිරවද්‍යතා දර්ශකයන්' (OVIs) ය. දහස් ගණනක් වූ ලීස්තර පුහුණු අත්පොත්වල (EC; DANIDA; DFID) අදාළ නි. නි. දර්ශකයන්හි (OVI) නිතරම ප්‍රමාණය, ගුණාත්මකභාවය, ඉලක්ක කණ්ඩායම (ම්), කාලය සහ ස්ථානය පෙන්නුම් කෙරේ. වෙනත් වචන වලින් කියන්නේ නම්, බෙදාහරිනු ලබන නිෂ්පාදනයේ ප්‍රමාණය හා ගුණාත්මකභාවය, නිපැයුම කා හට බෙදාහරිනු ලබන්නේ ද, ඒ කවදා කොහිදී කුමන අපේක්ෂිත බලපෑමක් ඇති කරමින් ද යනාදිය පෙන්නුම් කිරීම ඒවායින් අපේක්ෂා කෙරේ.

මීට පටහැනිව, කවදා හෝ ලීස්තරයක් ගොඩනගන්නට උත්සාහ කළ හෝ කවදා හෝ ඇගයීම් කාර්යයක නියැලුණු සෑම කෙනෙකුම පාහේ, ගැළපෙන දර්ශක, විශේෂයෙන් ම ප්‍රමාණාත්මක දර්ශකය වඩා ගුණාත්මක දර්ශකයන්, හඳුනා ගැනීම කොතරම් දුෂ්කර විය හැකිද යන්න පිළිබඳව සෘජු අත්දැකීම් ලබන්නට ඇත. මානුෂීය කටයුතු ක්ෂේත්‍රය තුළ SPHERE ව්‍යාපෘතිය මගින් අදාළ දර්ශකයන් ප්‍රමිතිගත කිරීම සඳහා සැලකිය යුතු තරම් උත්සාහයන් දරනු ලැබ තිබේ. එය මානුෂීය ප්‍රතිචාරය පිළිබඳව වූ ප්‍රධාන අංශ පහක අවම ප්‍රමිතීන් සකස් කිරීමෙහි යුරෝපීය සහ උතුරු ඇමෙරිකානු රාජ්‍ය නොවන සංවිධාන 225ක එකතුවක් නිරත කරවීය: ඒ අංශ නම්; ජලය සහ සනීපාරක්ෂාව; ආහාර සුරක්ෂිතතාව; පෝෂණය; සෞඛ්‍ය සේවාව; සහ නිවස හා එහි පිහිටීම තෝරාගැනීම යන්නයි. දැන් මේවා

හදිසි අවස්ථාවන්හි දී ලීස්තර රාමු සැකසීමේදී බහුල වශයෙන් යොදාගැනෙන අතර, ඉන්පසු කෙරෙන ඇගැයීම්වල දී යොදාගැනීමට ඉඩ තිබේ. එහෙත් SPHERE ව්‍යාපෘතියේදී ද දර්ශකයන්ගෙන් අති බහුතරයක් ප්‍රමාණාත්මක ස්වභාවයක් ගනී. මෙය අර්ධ වශයෙන් (කූඩාරම්, ඖෂධ වර්ග, පිරිසිදු ජලය සහ සනීපාරක්ෂණ යටිතල පහසුකම් සැපයීම වැනි) මානුෂීය ප්‍රතිචාරයන්ගේ ස්වභාවය පෙන්නුම් කරන නමුත්, ලීස්තර ක්‍රමවේදයේ සහ ආධාර දෙන්නන්ගේ ස්ථාවර ඇගයීම් ක්‍රියාවලින්හි මූලික දුබලතා ලෙස බොහෝ දෙනා සලකන දේද පෙන්නුම් කරයි.

නිසැකයෙන්ම ලීස්තර භාවිතය යම් යම් ප්‍රයෝජන ලබාදෙයි. එය ව්‍යාපෘති අරමුණු සහ උපකල්පන පැහැදිලි කොට ඒවා නිශ්චිත මැදිහත්වීම්වලට ආධාරක වශයෙන් යොදාගනියි. එය සැලසුම් ගත ක්‍රියාමාර්ග අපේක්ෂිත ප්‍රතිඵල සමග සවිඥානක ලෙස බද්ධ කිරීමේ අවශ්‍යතාව සහ සෑම එකටම අවශ්‍ය කරන යෙදැවුම්වල වර්ගය, පරාසය සහ ප්‍රමාණය පැහැදිලිව හඳුනා ගැනීමේ අවශ්‍යතාව අවධාරණය කරයි. විශේෂයෙන්ම ඊට ව්‍යාපෘතිවල කල්පැවැත්ම පිළිබඳ අපේක්ෂාවේ අවශ්‍යතාව ඉස්මතු කොට දැක්විය හැකිය.

කෙසේ වෙතත් ලීස්තරවල සීමාවන් ද ඇත. ක්‍රියාත්මක කරන ආයතන නව්‍ය ලෙස සිතනවාට වඩා යාන්ත්‍රික ලෙස සිතන්නට බලකරමින්, බොහෝ දෙනා ඒවා මතුපිටින් සීමා ඇති කරන සුලු යැයි සිතති. යෙදැවුම්, ක්‍රියාමාර්ග සහ ප්‍රතිඵල අතර ඍජු සහේතුක සබඳතාව ශක්තිමත් කිරීමට ඇති ඔවුන්ගේ නැඹුරුව නිසා මෙම ප්‍රතිඵලය ඇති වේ. මැන බැලිය හැකි දර්ශක හා සම්බන්ධ කාරණයේදී ප්‍රමාණාත්මකභාවය කෙරෙහි අවධාරණය කරන්නට ද මෙම නැඹුරුව මග පාදයි. තවද එය සමස්ත ප්‍රතිපත්තිමය ඉලක්ක හෝ අභිප්‍රාය කෙරෙහි අවධානය යොමු කරනවාට වඩා ව්‍යාපෘති මට්ටම කෙරෙහි අවධානයක් ඇති කරයි.



මෙහි ප්‍රතිඵලය ලීස්තරය තුළ හඳුනාගන්නා ලද අනතුරු හෝ උපකල්පනවලට පූර්ණ වශයෙන් මුහුණ නොදෙන වඩාත් ස්ථිතික විශ්ලේෂණයක් විය හැකිය. එය පවතින අවස්ථාවන් ඉස්මතු කොට දක්වන්නට බොහෝ සෙයින් උපකාරී වන ක්‍රමවේදයක් ද නොවේ. ඒ අනුව, ලීස්තර ක්‍රමවේදයේ ප්‍රශ්නකාරී ස්වභාවය සහ ව්‍යූහය ගැටුම ව්‍යාපෘතියේ ක්‍රියාමාර්ග මගින් විසඳන්නට උත්සාහ කරන්නක් ලෙස දකිනවාට වඩා, ගැටුම අනතුරක් ලෙස - ව්‍යාපෘතියට බරපතළ තර්ජනයක් එල්ල කළ හැකි මාරක උපකල්පනයක් - ලෙස දකින්නට නිත්‍ය ලෙසම මඟ පාදයි. මෙය ක්‍රමවේදයට ආවේණික වන්නක් නොව එය යොදාගන්නා ක්‍රමය තුළ ඇති දෙයකැයි එහි ආරක්ෂකයින් තර්ක කළ හැකිය.

මානුෂීය අගැයීම් ක්‍රමවේදය පිළිබඳව මෑතකදී කරන ලද OECD/ DAC දළ විග්‍රහයක් මෙම සීමාවන්ගෙන් සමහරක් හඳුනාගත් අතර, අගැයීම් 'ව්‍යාපෘතියට පමණක්' අවධානය යොමු කිරීමේ පටු සීමාවෙන් ඔබ්බට ගොස්, වඩා පුළුල්, ප්‍රතිපත්ති අරමුණු කරගත් ප්‍රවේශයක් ඇති කරගත යුතු යැයි තර්ක කරයි (OECD/ DAC 1999). මෙම පුළුල් විග්‍රහය තනි තනි ව්‍යාපෘතිවල හුදු තාර්කික බව සහ අරමුණු කෙරෙහි නොව, ඇගැයීම් කරන්නන් ඒවා වටිනා බව සැලකීමට මගපෑදූ වරම, පාදක විශ්වාස, උපකල්පන සහ මතවාද කෙරෙහි අවධානය යොමු කරනු ඇත. එය මේවා සහ නිශ්චිත ව්‍යාපෘති සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීම අතර පැවතිය හැකි ආතතීන් සම්බන්ධයෙන් ඍජු තක්සේරුවකට ඉඩ සලසා දෙනු

ඇත. එවැනි ප්‍රවේශයක් යම් තත්ත්වයක අස්ථිර බව, සංකීර්ණ බව සහ අන්තර් සම්බන්ධිත බව සහ ඊට දක්වෙන ප්‍රතිචාරයන්ගේ පරාසය යනාදිය වඩා හොඳින් ග්‍රහණය කරගනු ඇතැයි තර්ක කෙරේ.

හේතු ඵල සම්බන්ධය කෙරෙහි වූ පටු ඍජු රේඛීය අවධානයක සිට සිදුවීම් ක්‍රියාවලි සහ ව්‍යුහයන් පිළිබඳ මතුපිටින් පෙළ ගසන ලද විස්තර, දක්වා මාරුවීමේදී අගැයීමක් ඉලක්ක කරන්නේ නිරවද්‍යතාවට වඩා වලංගුභාවයයි. වඩා පුළුල් ප්‍රතිපත්ති මට්ටමක් පිළිබඳ විග්‍රහය සම්බන්ධයෙන් වූ මෙම වෙනස ගැටුම් ගතිකත්වයන් සහ සාමය ගොඩනැගීමේ අවස්ථා පිළිබඳ ප්‍රතිපත්තියේ බලපෑම වඩාත් උපායික ලෙස තක්සේරු කිරීම සඳහා පදනමක් සපයන අතර, එය තවදුරටත් ව්‍යාපෘති මට්ටමේ අගැයීම් අතර පරතරයක් තබයි. තවද සංවර්ධන සහ මානුෂීය කටයුතු ක්ෂේත්‍රයන් වෙනුවෙන් සකස් කරන ලද ප්‍රමිතිගත නිර්ණායකයෙහි සා. ගැ. බ. අ. (PCIA) ට අදාළ සහ ඊට උපකාරී වන බොහෝ දේ තිබුණ ද, ස්වභාවයෙන්ම මේවාට තනිවම, සා. ගැ. බ. ඇ. ට ආවේණික වූ ක්‍රියාකාරී ක්‍රමවේදයක් නිර්මාණය කිරීම සඳහා වූ ප්‍රමාණවත් පදනමක් සැපයිය නොහැකිය.

## 3. සංවර්ධන ව්‍යාපෘති, ගැටුම සහ සා. ගැ. බ. ඇ.

ප්‍රායෝගික සා. ගැ. බ. ඇ. ක්‍රමවේදයක් සකස් කර ගැනීම සඳහා දරන ලද අතිශයින් වැදගත් උත්සාහයක් වූයේ කැනේඩියානු ජාත්‍යන්තර සංවර්ධන පර්යේෂණ මධ්‍යස්ථානයේ (IDRC) සාමය ගොඩනැගීමේ සහ ප්‍රතිසංස්කරණ වැඩසටහන සඳහා ඉදිරිපත් කරන ලද කේන් බුෂ්ගේ "A measure of Peace" ය (1998). සා. ගැ. බ. ඇ. ක්‍රමවේදයන් සකස් කිරීමේ උත්සාහයන් මූලික වැරදි අවබෝධයක් ඇති කරන බව සිය ගැඹුරු සහ හැඟීම් අවුළුවනසුලු පත්‍රිකාවෙන් බුෂ් අවධාරණය කරයි. මෙහිදී ඔහු හඳුනාගන්නා දුෂ්කරතාව නම්, බොහෝ ප්‍රවේශයන් සාමය ගොඩනැගීම *බලපෑමක්* ලෙස සිතනවාට වඩා විශේෂිත වර්ගයක *ක්‍රියාමාර්ගයක්* ලෙස දකින්නට පෙළඹීමයි.



බුෂ් (1998, 7) සා. ගැ. බ. අ. නිර්වචනය කරන්නේ:

> 1. *සාමකාමී සහජීවනය සඳහා වූ අපේක්ෂාවන් ශක්තිමත් කරන්නාවූ ද, ප්‍රචණ්ඩ ගැටුම් පුපුරායාමේ, යළි පැනනැගීමේ හෝ අඛණ්ඩව සිදුවීමේ හැකියාව අඩු කරන්නා වූ ද ව්‍යුහයන් සහ ක්‍රියාවලීන් කෙරෙහි සහ; 2. ගැටුමට පූර්ණ ප්‍රචණ්ඩ ක්‍රමයක් මගින් මුහුණදීමේ හැකියාව වැඩි කරන ව්‍යුහයන් හා ක්‍රියාවලීන් කෙරෙහි යෝජිත සහ අවසන් කරන ලද සංවර්ධන ව්‍යාපෘතිවල බලපෑම ඇගැයීමේ සහ හැකි තරම් දුරට අපේක්ෂා කිරීමේ විධි ක්‍රමයක් වශයෙනි.*

එවැනි ප්‍රශ්නවලට පිළිතුරු දීම සඳහා විශ්ලේෂණාත්මක මෙවලම් සකස් කර ගන්නට අප අසමත් වන්නේ නම්, "අපට කළ හැකි වන්නේ අපගේ ක්‍රියාමාර්ගවල හිතකර හෝ අහිතකර බලපෑම් ලැයිස්තුගත කිරීම, අවධාරණය කිරීම හෝ අනුමානය කිරීම පමණි" (Bush 1998,4).

බුෂ් සාමය ගොඩනැගීම බලපෑමක් වශයෙන් ප්‍රතිස්ථානගත කිරීම සහ සා. ගැ. බ. ඇගැයීමෙහි ස්වභාවය සහ අරමුණු පිළිබඳ ඔහුගේ විග්‍රහය වැදගත් ප්‍රතිඵල ගණනාවක් ඇති කරයි. පළමුව, අවධාරණය යොමු කරනු ලබන්නේ ස්ථානය වෙතය: මෙහිදී අප ගැටුම සහ සාමය ගොඩනැගීමේ

බලපෑම් සොයාගත යුත්තේ කොතැනින්දැයි දැන ගත යුතුව ඇත, එනම්, කුමන සමාජ ස්ථානවලද ද, අංශවල ද හා මට්ටම්වල ද යන්නයි.

දෙවනුව, සහ පළමුවැන්නට අනතුරුව, ඇත්තේ සුදුසු දර්ශකයන් නිර්මාණය කිරීම වැදගත් කටයුත්තක් වන අතර, මේ බලපෑම් ඇති විය හැකි *තත්ත්වයන්* පිළිබඳ අවබෝධයක් ඇති කිරීම ද ඒ හා සමාන ලෙස වැදගත් වේය යන අනුමිතියයි. එනම් සා. ගැ. බ. ඇගැයීමක් නිතරම සන්දර්භයට සංවේදී විය යුතුය යන්නයි (උදාහරණයක් වශයෙන්, ගැටුම් ගතිකත්වයේ ස්වභාවය, වර්ගය සහ අදියර, එසේම වැඩසටහන් සකස් කෙරෙන්නේ ඍජුවම හමුදාමය වශයෙන් ප්‍රචණ්ඩ තත්ත්වයක් යටතේද? දිග්ගැසුණු එහෙත් ඇණහිට ඇති ගැටුම් තත්ත්වයක් යටතේ ද, එසේ නැතිනම් සැඟවුණු ගැටුම් තත්ත්වයක් යටතේ ද යන්නයි).

තුන්වැනි අනුමිතියක් වන්නේ සංවර්ධනය සහ සාමය ගොඩනැගීමේ ව්‍යාපෘති අතර වූ, ගැඹුරු සීමාවන් බිඳ හෙළීමයි. බුෂ්ගේ මතය අනුව, යහපත් පාලනය පිළිබඳ ක්ෂේත්‍රයේ ඇති බාහිර වශයෙන් දේශපාලනමය වූ ඒවා පමණක් නොව, *සියලුම* සංවර්ධන ව්‍යාපෘති සාමය ගොඩනැගීමේ *ආසන්න* හෝ සැබෑ බලපෑමක් ඇති කරයි.

සිව්වැනිව, මතු ඇතිවිය හැකි බලපෑම් අපේක්ෂා කිරීම ඉලක්ක කරගන්නා පූර්ව - ව්‍යාපෘති තක්සේරුව සහ සැබෑ බලපෑම තක්සේරු කරන මුත්, පටු සංවර්ධනාත්මක අර්ථයෙන් එසේ නොකොට, සාමය ගොඩනැගීමේ පුළුල් බලපෑම් කෙරෙහි සිත යොමු කරන පශ්චාත් - ව්‍යාපෘති ඇගැයීම් වෙන් කොට දැක්වීමේ අවශ්‍යතාව බුෂ් අවධාරණය කරයි. මෙය වැදගත්යැයි බුෂ් තර්ක කරයි. මක්නිසාදයත් 'සීමිත සංවර්ධනාත්මක නිර්ණායකයන් අනුව ව්‍යාපෘතියක් අසාර්ථක විය හැකි මුත්, පුළුල් සාමය ගොඩනැගීමේ නිර්ණායකයන් අනුව සාර්ථක විය හැකිය; (එසේම විලෝම වශයෙන්) පූර්ව නිශ්චිත සංවර්ධනමය නිර්ණායකයන් අනුව ව්‍යාපෘතියක් සාර්ථක විය හැකි මුත්, සාමය කෙරෙහි වූ ඵලදායී බලපෑමක අර්ථයෙන් අසාර්ථක විය හැකිය" (Bush 1998, 6).

මෙහිදී බුෂ් විභාග සමත්වන ශිෂ්‍යයින්ගේ සංඛ්‍යාව අනුව සිය ඉලක්ක සපුරා ගැනීමට අසමත් වුවද, අන්තර් කණ්ඩායම්/ ප්‍රජාවන් අතර ආතතීන් අඩු කිරීම අතින් සාර්ථක වූ අධ්‍යාපන ව්‍යාපෘතියක් පිළිබඳ නිදර්ශනයක් ඉදිරිපත් කරයි. පටු අර්ථයෙන් එවැනි වැඩසටහනක් අසාර්ථක එකක් ලෙස සැලකෙනු ඇත; එහෙත් සාමය ගොඩනැගීම පිළිබඳ පුළුල් අර්ථයෙන් එය සාර්ථක එකක් වනු ඇත. මීට ප්‍රතිවිරුද්ධ තත්වයද මෙහිලා හොඳින් ගැළපෙන බව බුෂ් පෙන්වා දෙයි: බොහෝ සිසුන් ඔවුන්ගේ විභාගවලින් සමත් විය හැකි නමුත්, මෙම ක්‍රියාවලියේදී ප්‍රජාවන් අතර ආතතිය අවුළුවනු ලැබ තිබිය හැකිය. එසේ වන්නේ විශේෂයෙන්ම, අසමත් වන්නන් එකම කණ්ඩායමකට හෝ සමාජයේ එකම කොටසකට හෝ අයත් නම් තමන් කොන් කරනු ලැබීය යන කණ්ඩායමක අනුමානය ශක්තිමත් කරමින් නොසන්සුන්තා ඇවිළ යා හැකිය. ඒ අනුව වාසිදායක සංවර්ධනමය ප්‍රතිඵල සමඟ සාමය ගොඩනැගීම සම්බන්ධයෙන් අවාසිදායක ප්‍රතිඵල ඇති විය හැකිය.

පූර්ව - ව්‍යාපෘති ඇගැයීම යනු - ගැටුම් පරිසරයේ ගතිකත්වය සහ යෝජිත ව්‍යාපෘතිය කෙරෙහි එයින් ඇති විය හැකි බලපෑම පරීක්ෂා කරන සෝදිසි ක්‍රියාමාර්ගයක් වශයෙන් බුෂ් හඳුන්වයි (Bush 1998, 12-19). ඔහු එවැනි පූර්ව-අගැයීමක් සඳහා සැලකිලිමත් විය යුතු පුළුල් ක්ෂේත්‍ර හතරක්

හඳුනා ගනියිඃ ස්ථානය, කාලය, දේශපාලන සන්දර්භය සහ වෙනත් ප්‍රධාන සාධක ඒවාය. දේශපාලන ව්‍යූහ, ක්‍රියාවලීන් සහ සබඳතා කෙරෙහි ගැටුමේ බලපෑම, ආර්ථික සහ භෞතික යටිතල පහසුකම් කෙරෙහි එහි බලපෑම සහ මානව හා සමාජ ප්‍රාග්ධනය කෙරෙහි එහි බලපෑම ඇතුළුව යෝජිත ව්‍යාපෘති ක්ෂේත්‍රය තුළ ගැටුමත්, එහි ගතිකයනුත් එහි උරුමයනුත් පිළිබඳ පොදු හැඳින්වීමක් සඳහා මේවා පදනමක් සපයයි. ගැටුමේ ගතිකත්ව පිළිබඳව එවැනි පුළුල් ඇගැයීමක් කළ පසු, ඇගැයීම් කරන්නන් නිශ්චිත ප්‍රභේද තුනක ප්‍රශ්න කෙරෙහි සිය අවධානය යොමු කළ යුතුයඃ

### 1. පාරිසරික / සන්දර්භමය කාරණා

- අවම වශයෙන් පුරෝකථනය කළ හැකි සහ ස්ථාවර දේශපාලනික, නෛතික සහ ආරක්ෂක ව්‍යූහයන් තිබේද? මෙය ගැටුමක් මගින් මෙම ව්‍යූහයන්ගේ කෘත්‍යමය ශක්‍යතාවට කළ හැකිව තිබුණු හානිය ගැන සහ එම හානියේ සහ අක්‍රිය වීමේ මට්ටම ව්‍යාපෘතියකට පිළිගත හැකි අවදානමක් ඇති කරන්නේද යන්න ගැන ඇගැයීමක් කරයි.
- යටිතල පහසුකම් තත්ත්වය කුමක් ද? මෙය පවතින හානියට පත් හා / හෝ දිරාපත්වන යටිතල පහසුකම් මගින් ව්‍යාපෘතියක් කෙසේ ක්‍රියාත්මක වන්නේද යන්න පිළිබඳව සහ එය සිය සංවර්ධන ප්‍රතිසංස්කරණ කටයුතුවලට දායක වන්නේ කෙසේද යන්න පිළිබඳව ඇගැයීමක් කරයි.
- ප්‍රස්තා දොරටුව විවෘත වෙමින් පවතින්නේ ද නැත්නම් වැසී යමින් පවතින්නේද? මෙය දේශපාලන, ආර්ථික හා සමාජ ගතිකත්වයේ පහත වැටීම සහ ගලා යාමත් ඒවා ව්‍යාපෘතියකට පහසුවක් වේ ද, නැත්නම් බාධාවක් වේ ද යන්නත් තක්සේරු කරයි. උදාහරණයක් වශයෙන් පශ්චාත් වර්ණභේදවාදී දකුණු අප්‍රිකාවේ අත්දැකීම් ඉදිරිපත් කරමින්, විවෘත තත්ත්වයක් අනිවාර්යයෙන්ම සාර්ථක සාමය ගොඩනැගීමේ බලපෑමක් සහතික නොකරන බව බුෂ් සඳහන් කරයි.

### 2. ව්‍යාපෘති විශේෂිත කාරණා

- ව්‍යාපෘතිය සතුව නිවැරදි සම්පත් සංකලනය තිබේද?
- ප්‍රධාන සංවිධානය සතුව අවශ්‍ය අත්දැකීම හෝ කලාපයේ සංසන්දනාත්මක වාසිය තිබේද? මෙය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන සංවිධානයේ අතීත වාර්තාව, එහි හවුල්කරු ජාලය, සහ එය විශේෂිත කුසලතා දක්වා ඇති ප්‍රමාණය, ව්‍යාපෘතිය සම්බන්ධයෙන් දක්වන හැකියාව සහ ධාරිතාව විශේෂඥ දැනුම ආදිය ඇගැයීමට ලක් කරයි.
- ව්‍යාපෘතියේ 'ඔරොත්තු දීමේ මට්ටම' කුමක්ද? මෙය අවිනිශ්චිතතා, අනියත බව, අවදානම, පාඩුවීම්, වෙනස්වීම් ආදියේදී ප්‍රතිචාර දැක්වීමේ ධාරිතාව ඇගැයීමට ලක් කරයි.
- සුදුසු කාර්ය මණ්ඩලයක් සිටීද? ක්‍රියා කළ යුතු පටු තාක්ෂණික ධාරිතාව මෙන්ම දේශපාලන අවකාශය සොයාබැලීම, නිර්මාණය සහ උපරිමකරණය ආදියට ඇති හැකියාව යන දෙක ම තක්සේරු කරයි.

## 3 ව්‍යාපෘති - පරිසර අනුරූපතාව

- ව්‍යාපෘතියට ඇති දේශපාලන සහයෝගීතාවේ මට්ටම කුමක්ද? මෙය ප්‍රාදේශීය, කලාපීය සහ ජාතික දේහපාලන ක්‍රියාධරයින් වෙතින් මෙන්ම උනන්දුවක් දක්වන අනෙකුත් පාර්ශ්වයන් (ආධාර දෙන්නන්, රාජ්‍ය සංවිධාන, වෙනත් රාජ්‍ය නොවන සංවිධාන) වෙතින් ලැබෙන සහාය මැන බලයි. තවදුරටත් මැන බැලෙන්නේ තමන්ගේ සංවිධානය තුළින් ලැබෙන සහයෝගයයි.
- ව්‍යාපෘතිය සම්බන්ධයෙන් අදාළ බලධාරීන්ගේ සහ ප්‍රජාවගේ විශ්වාසය, සහයෝගය සහ සහභාගිත්වයක් ද තිබේද? මෙය ව්‍යාපෘතියකට අදාළ සහභාගීත්ව පරිමාණයේ මට්ටම සහ ස්වභාවය ඇගැයීමට ලක් කරයි.
- ව්‍යාපෘතිය තිරසාර එකක්ද? මෙය ව්‍යාපෘතිය අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය සම්පත් (ආයතනික, මානව හා මූල්‍ය) නොකඩවා උත්පාදනය කිරීමේ හැකියාව තක්සේරු කරයි.

ඉහත කී නිර්ණායක, ප්‍රශ්න සහ තැකිය යුතු කාරණා පදනම් කරගෙන අගැයීමක් කළ පසු ව්‍යාපෘතියේ කාලය, ව්‍යුහය සහ අරමුණු වෙනස් කර ගැනීම අවශ්‍ය විය හැකිය. අනතුරුව සැලසුම් කළ ආකාරයට ව්‍යාපෘතිය ඉදිරියට ගෙන යාම, සංශෝධිත වෙනස්කම් හෝ අතිරේක ව්‍යාපෘතියක් මගින් එය විස්ථාපනය කිරීම හෝ ව්‍යාපෘතියේ නිශ්චිත අරමුණුවලට ගැළපෙන තත්ත්වයක් ඇතිවන තෙක් කිසිවක් නොකර සිටීම පිළිබඳව තීරණයක් ගත හැකිය. විශේෂයෙන්ම, මෙය සැබෑ සාමය ගොඩනැගීමේ බලපෑම් ඇගැයීමට අවශ්‍ය කරන පදනමක් සපයයි.



පශ්චාත් ව්‍යාපෘති ඇගැයීම්වලදී, ව්‍යාපෘතියක සාමය ගොඩනැගීමේ පුළුල් බලපෑම් පිළිබඳව විමසා බලන පුළුල් ක්ෂේත්‍ර හතරක් බුෂ් හඳුනා ගනියි (Bush 1998,22-24).

1. **තනි තනි හෝ සාමූහික ද්‍රව්‍යමය හා ද්‍රව්‍යමය නොවන සම්පත් අත්කර ගැනීමෙහි දී ව්‍යාපෘතිය සැලකිය යුතු හෝ දේශපාලනික වශයෙන් වැදගත් වෙනස්කම් ඇති කළේ ද?**

උදාහරණයක් වශයෙන් එය ජලය, ඉඩම්, ආහාර, දේශපාලන ආයතන හා ක්‍රියාවලීන්, ආර්ථික සම්පත්, සමාජ සහ / හෝ සංස්කෘතික තරාතිරම්, තත්ත්වයන්, තොරතුරු, නීත්‍යානුකූල භාවය, අධිකාරීත්වය අත්කර ගැනීමට පහසුකම් සැලසුවේ ද?

2. **ව්‍යාපෘතිය සමාජ ආර්ථික ආතතීන් ඇති කළේ ද ඇවිළවී ද, එසේ නැතිනම් ලිහිල් කළේ ද?**

එය, ආර්ථික, අධ්‍යාපනික, කෘෂිකාර්මික, කාර්මික අංශවලට ප්‍රවේශවීමට අනෙක් කණ්ඩායම්වලට වඩා එක් කණ්ඩායමකට ඇති වරප්‍රසාදය තහවුරු කිරීමට කටයුතු කළේද? එසේ නැතහොත් එය මෙම අංශවල නිලපැලැන්ති හා බෙලහීනකම් අඩු කිරීමට කටයුතු කළේ ද?

3. **ව්‍යාපෘතිය ආර්ථික චිරස්ථිතියේ හෙවත් හෝ ආහාර සුරක්ෂිතභාවයේ භෞතික පදනම සැලකිය යුතු තරම් වෙනස් කළේ ද?**

උදාහරණයක් වශයෙන් එය ජීවිකා වෘත්තීන්ට ඍජුව බලපාන නව තාක්ෂණික ක්‍රම, තාක්ෂණය සැපයුවේද? එය යුද නායකත්වය සඳහා වූ අවස්ථාවන් හෝ යුද නායකත්වයේ බලපෑම

අවම කරන දේශපාලන ආර්ථික න්‍යාය කෙරේ බලපෑම් ඇති කළේ ද? එය සිවිල් ගැටුම් බද්ධ දේශපාලන ආර්ථිකයෙන් පරිබාහිර වන සිතන ප්‍රාදේශීය ආර්ථිකයන් බිහි කළේ ද (Anderson 1999)?

4. **ව්‍යාපෘතිය පවතින දේශපාලන, ආර්ථික සහ/ හෝ සමාජ ක්‍රමවලට අභියෝග හෝ ගැළපෙන වෙනස්කම් හෝ පාලනයක් ඇති කළේද?**

ව්‍යාපෘතිය පුද්ගලයින්ගේ/ කණ්ඩායම්වල ජීවිතයේ දේශපාලන, ආර්ථික, සමාජ අංශවල පාලනයක් ඇති කිරීමටසමත් වීද? පවතින පාලන ක්‍රමයන්ට අභියෝග කොට විකල්ප පාලන ක්‍රම ඇති කිරීම සඳහා ඒවාහි අභිවර්ධනයට කටයුතු කළේ ද?

සිය ලියවිල්ලේ අවසාන කොටසේදී *ස්ථානය* සොයා ගන්නටත් නිවැරදි *ප්‍රශ්නය* අසන්නටත් අප යොමු කළ හැකි සා. ගැ. බ. අ. රාමුවක නිදර්ශනයක් වශයෙන් සටහන් කළ යුතු සංයුක්ත කාරණා පහක් බුෂ් හඳුනා ගනී (කොටුව 2 බලන්න). මේවා සාමය කෙරෙහි සහ ගැටුම් තත්වයන් කෙරෙහි ඇති කෙරුණු අතීත බලපෑම හෝ ඇති විය හැකි බලපෑම ඇගැයීම සඳහා පදනම සපයා දෙයි (Bush 1998, 25-31). සිය ප්‍රශ්න ලැයිස්තුව විස්තරාත්මකවීමට වඩා යෝජනාත්මක කරනසුලු යැයි බුෂ් සඳහන් කරයි. නිශ්චිත බලපෑම් පිළිබඳ තක්සේරුවක් මෙන්ම, නිශ්චිත ඇගයීමකදී යොදාගන්නා නිශ්චිත ප්‍රශ්න ද ඇත්ත වශයෙන්ම ව්‍යාපෘතියෙන් ව්‍යාපෘතියට තීරණය කිරීම අවශ්‍ය වේ.

එවැනි බලපෑම් මැන බැලීමේ පදනමක් සැපයිය හැකි දර්ශක සම්බන්ධයෙන් ද මෙය සත්‍යය ය. බුෂ්ගේ මතය අනුව මේවා "භාවිත කරන්නා විසින් මෙහෙයවනු ලබන" ඒවා විය යුතුය. ක්‍රියාත්මක කරන ආයතනයක් විසින් හඳුනාගනු ලැබිය හැකි ප්‍රශ්න සහ ඇගැයීම්වලට වඩා වෙනස් ප්‍රශ්න සහ අගැයීම් ආධාර දෙන්නන්ට ලැබෙනු ඇත.



අනෙක් අතට මේවා ව්‍යාපෘතියක ප්‍රතිලාභීන් සහ සහභාගී වන්නන් විසින් හඳුනා ගනු ලැබිය හැකි ඒවායින් වෙනස් විය හැකිය. බුෂ් තර්ක කරන්නේ න්‍යායානුකූලව සැකසූ දර්ශක යම් යම් දේ විදහා දක්වන තරමටම වසන් කරන බවයි; හේතුව වන්නේ නිතරම යොදාගනු ලබන ඇගැයුම් කුමය ගැන බෙහෙවින් කතා කරනු මිස ව්‍යාප්ති ඇගැයුමක් නොකරන ලෙසයි. ඒ වෙනුවට ඔහු අගැයීම් ක්‍රියාවලියක දී විවිධ වූ ව්‍යාපෘති හවුල්කරුවන්ගේ සහ සහභාගීවන්නන්ගේ වෙනස් වූ සියලුම අවශ්‍යතාවන් වඩා හොඳින් සපුරාලිය හැකි 'කලෙයිඩෝස්කෝප්' 'විජ්ජා පෙට්ටියක්' බඳු දර්ශක පෙළක් ඉල්ලා සිටී.

යෝග්‍ය සා. ගැ. බ. ඇ. (PCIA) රාමුවක් මතුකර දැක්වීමට ගත් බුෂ්ගේ වෑයම සම්බන්ධයෙන් කරුණු ගණනාවක් සඳහන් කිරීම වටී. පළමුව, පුළුල්, මෙන්ම සාමාන්‍ය එකකින් වඩාත් නිශ්චිත එකක් වෙතට යන අර්ථ දැක්වීමේ සා. ගැ. බ. අ. රාමුවලින් සැදුම්ලත් බහු ස්ථර, එකපිට එක කඩා හැළෙන කඳුලැලි වැනි රාමු පෙළක් බුෂ් ඉදිරිපත් කරයි. එහෙත් විවිධ රාමු අතර, සම්බන්ධයේ සැබෑ ස්වරූපය පැහැදිලි නැත. තම පූර්ව-ව්‍යාපෘති අගැයීම පශ්චාත් ව්‍යාපෘති ඇගැයීම්වලට පදනමක් සපයන බව බුෂ් ප්‍රකාශ කළ ද, පූර්ව-ව්‍යාපෘති අදියරේදී හඳුනාගන්නා ලද සාධක සහ අවසානයේදී හඳුනාගන්නා ලද සා. ගැ. බලපෑම් සාධක අතර, පූර්ව නිර්මිත අනුරූපතාවක් හෝ සබඳතාවක් ඇති බවක් පෙනෙන්නට නැත (cf.Leonheardt 1999).

බුෂ්ගේ වඩා නිශ්චිත රාමුව පවා සීමිත විස්තර ප්‍රමාණයක් ලබා දෙන බොහෝ දුරට පුළුල් සහ *පොදු* එකකි. තම ප්‍රවේශයේ ශක්තියක් ලෙස බුෂ් මෙය සලකයි. ඇගැයීමට ලක් කළ යුතු ව්‍යාපෘතියට වඩා ස්ථිර *මූලික* දර්ශකයන් ඇගැයීම් ක්‍රම පිළිබඳව වැඩි යමක් පවසන බවට තර්ක කිරීමේ දී ඔහු නිවැරදි වන්නා සේම දර්ශකයන්ගේ අපැහැදිලි බවට ද ඇගැයීම් ක්‍රමයක් පිළිබඳව වෙළුම් ගණනින් කතා කළ හැකිය යන්නද සත්‍යයකි. විශේෂයෙන්ම එය එවැනි සා. ගැ.බ. අ. රාමුවක් ඵලදායී ලෙස ක්‍රියාත්මක කරන්නට ආධාර දෙන්නන්ට, ක්‍රියාත්මක කරන ආයතනවලට, හවුල්කරුවන්ට, සහභාගිවන්නන්ට හෝ බාහිර ඇගැයීම්කරුවන්ට ඇති හැකියාවට බාධා කළ හැකිය.

ඇගැයීම් තීරණායකයන් සිද්ධියෙන් සිද්ධියට සකස් වීමට ඉඩ හැරීමේ ලිහිල් ප්‍රවේශය, සහ පූර්ව-නිශ්චිත, පූර්ව-විනිශ්චය කරන දර්ශකයන් පෙළ අතර තුලිත බවක් ඇති කර ගැනීම අවශ්‍යය. මෙහිදී අවශ්‍ය වන්නේ අංශ, මට්ටම්, ව්‍යාපෘති වර්ග, සහ ගැටුම් තත්ත්වයන් තුළ දර්ශකයන්ගේ යෝජිත විස්තර සහිතව දර්ශකයන්ගේ පුළුල් වර්ගවේදයන්ගේ සංවර්ධනයයි. යහපත් පාලනයක් සහ මානව හිමිකම් ව්‍යාපෘතීන්ට අදාළ දර්ශකයන් පිළිබඳ සිය සාකච්ඡාවේදී බුෂ් මෙය කරන්නට පටන් ගනියි (Bush 1998, 21-22).

දෙවනුව බුෂ් සා. ගැ. බ. (PCI) ක්ෂේත්‍ර හෝ අංශ පහ හඳුනා ගැනීම සා. ගැ. බ. අ. ක්‍රමවේද නිවැරදි දිශාවට යොමු කරයි. මෙම ක්ෂේත්‍රවල ගුණාංග නිවැරදිව දැක්වීම සම්බන්ධයෙන් වෙනස්කම් ඇතිවිය හැකි අතර, පැහැදිලිව ම මෙම ප්‍රභේදයන් හඳුනාගැනීමට සහ ඒවා සම්බන්ධයෙන් එකඟතා ඇති කර ගැනීමටත්, ඒවායේ අන්තර්ගතය වැඩි දියුණු කිරීමටත් කටයුතු කළ යුතුව ඇත. එහෙත් මෙම, ක්ෂේත්‍රයේ ප්‍රයත්න "සාමය ගොඩනැගීම පිළිබඳ සංශෝධිත මානව ආරක්ෂක ප්‍රවේශය' යනුවෙන් හැඳින්විය හැකි දෙය වටා එක් රැස්වනු දක්නට ලැබීම උනන්දුව ඇති කරවනසුලුය (Cockell 1998; Leonhardt 1999). පූර්ව අනතුරු ඇඟවීම සහ වැළැක්මේ ක්‍රියාමාර්ග පිළිබඳ එ. ජා. කාර්යමණ්ඩල විද්‍යාලයේ පුහුණු වැඩසටහන සංශෝධිත මානව ආරක්ෂක ප්‍රවේශයක් යොදාගනියි. එය අංශ හයක් හඳුනාගනී: මානව හිමිකම් සහ පෞද්ගලික ආරක්ෂාව; රාජ්‍ය පාලනය සහ දේශපාලන ක්‍රියාවලීන්; සමාජමය සහ ප්‍රජා ස්ථාවරත්වය; සමාජ - ආර්ථික; හමුදාමය සහ විදේශ ඒ හයයි. මේවා ගතික ආංශික ගැටුම් විශ්ලේෂණයේත්, දර්ශන පථය ගොඩනැගීම සහ වැළැක්වීමේ ක්‍රියාමාර්ග සඳහා අනතුරු හා අවස්ථා හඳුනා ගැනීමේ ත් යෙදීම සඳහා පදනම වශයෙන් භාවිත කෙරේ (www.itcilo.it/UNSCP/programmefocus/earlywarning).



ඉන්ටර්නැෂනල් ඇලර්ට් ආයතනය වෙනුවෙන් කරන ලද සිය දළ සමාලෝචනයෙන් ගැටුම් විශ්ලේෂණය, ව්‍යාපෘති අවදානම් තක්සේරුව සහ ව්‍යාපෘති අධීක්ෂණය සහ ඇගැයීම් යනාදිය සඳහා දර්ශකයන් ඉදිරිපත් කිරීමේ දී ලියොන්හාට් තමා යොදාගන්නා තේමා ක්ෂේත්‍ර හතරක්-එනම් රාජ්‍ය පාලනය, ආර්ථිකය, සමාජ - සංස්කෘතික සාධක සහ ආරක්ෂාව-හඳුනා ගනී.

දැනට තිබෙන ආකාරයට බුෂ්ගේ රාමුවෙහි සැබෑ සීමිත බව නම්, එය ක්ෂේත්‍ර අතර ගතික අන්තර්-ක්‍රියාකාරීත්වය සඳහා කිසිම ක්‍රමයක් ඉදිරිපත් නොකිරීමයි. එහිලා හුදෙක් නිශ්චිත සා. ගැ. බ. ක්ෂේත්‍රයක් තුළ දිග හැරෙන දේ පමණක් නොව, මෙම විවිධ වූ ක්ෂේත්‍ර එකිනෙක අතර කෙරෙන අන්තර් ක්‍රියාකාරීත්වයේ බලපෑම් ද වැදගත් වේ. සමාජ බලගැන්වුම හමුදාමය සහ මානව ආරක්ෂාව

සමග අන්තර් සම්බන්ධතා පවත්වන්නේ, ශක්තිමත් කරන්නේ හෝ යටපත් කරන්නේ කෙසේද? විශේෂිත අවස්ථාවකදී අප එක් එක් අංශයට දිය යුතු සාපේක්ෂ වැදගත්කම කුමක්ද?

තුන්වනුව, සාමය ගොඩනැගීමේ විභවයක් ඇති සංවර්ධන ව්‍යාපෘති හා විශේෂයෙන් සාමය ගොඩනැගීම සඳහා වූ ව්‍යාපෘති වෙන් කොට දැක්වීමේ අවශ්‍යතාව බුෂ් ගෙන හැර දැක්වුවද, ඔහුගේ රාමුව පළමු වැන්නට බර වූවකි. තමන් ගෙනහැර දක්වා ඇති දළ සටහනේ සියල්ල නොවේ නම් ඉන් වැඩි කොටසක් විශේෂිත සාමය ගොඩනැගීමේ ක්‍රියාමාර්ගවලට අදාළ වනු ඇතැයි බුෂ් තර්ක කරනු ඇති නමුත්, එවැනි වැඩසටහන්වල හෝ ව්‍යාපෘතිවල ඇති සියුම් කරුණුවලට විශේෂිත වූ සා. ගැ. බ. අ. ප්‍රවේශයක් අවශ්‍ය කරන්නේදැයි අප තවදුරටත් පූර්ණ වශයෙන් විමසා බැලිය යුතුය.

## වගුව 2 : සාමය සහ ගැටුම කෙරෙහි බලපෑම් ඇති විය හැකි ක්ෂේත්‍ර

| සා. ගැ. බ. ක්ෂේත්‍ර | නිදර්ශන |
|---|---|
| ප්‍රචණ්ඩ ගැටුම් පාලනය කිරීමට/ විසඳීමට සහ ඉවසීම වර්ධනය කොට සාමය ගොඩනැගීමට ඇති ආයතනික හැකියාව | සාමය හා ගැටුම් පිළිබඳ අභියෝග සහ අවස්ථාවන් හඳුනාගෙන ඒවාට ප්‍රතිචාර දැක්වීමට ඇති හැකියාව; සංවිධානාත්මක ප්‍රතිචාරාත්මකභාවය, නිලධාරී නම්‍යශීලීත්වය; කාර්යක්ෂමතාව, සහ ඵලදායකත්වය; වෙනස්වන පරිසරයට සහ අවශ්‍යතාවන්ට ගැළපෙන ලෙස ආයතනික කාර්යභාරයන් සහ අපේක්ෂාවන් නවීකරණය කිරීමේ හැකියාව, මූල්‍ය කළමනාකරණය ආදිය කෙරෙහි බලපෑම |
| හමුදාමය සහ මානව ආරක්ෂාව | ප්‍රචණ්ඩත්වයේ මට්ටම, තීව්‍රතාව, ගතිකත්වය, ප්‍රචණ්ඩ චර්යාව; ආරක්ෂාව සහ අනාරක්ෂාව (පුළුල් ලෙස නිර්වචනය කොට ඇත; සුරක්ෂිත බව/ ආරක්ෂාව පිළිබඳ ප්‍රතිපත්තිය; ආගමනය, විසුරුවා හැරීම සහ යළි එක්තැන් කිරීම; පොලිස් හා ආරක්ෂක සේවාවන්/ ව්‍යූහයන් ප්‍රතිසංවිධානය කිරීම; සහ ප්‍රතිපුහුණු කිරීම; නිරායුධකරණය, මංපැහැරීම, සංවිධානාත්මක අපරාධ ආදිය කෙරෙහි ඍජු වක්‍ර බලපෑම. |
| දේශපාලන ව්‍යූහයන් සහ ක්‍රියාවලීන් | ජාතික මට්ටමේ ආණ්ඩුවේ සිට නාගරික සභාව දක්වා රාජ්‍ය හැකියාවන්; ප්‍රතිපත්ති අන්තර්ගතය සහ සාර්ථකභාවය; විමධ්‍යගතකරණය / බලය එක්තැන් කිරීම; දේශපාලන වාර්ගිකකරණය; නියෝජනය; පාරදෘශ්‍යභාවය; විශ්වසනීයත්වය,; ප්‍රජාතන්ත්‍රවාදී සංස්කෘතිය, සංවාදය, ගැටුම්වලට මැදිහත්වීම සහ සමගි කිරීම; සිවිල් සමාජ ක්‍රියාධරයින් ශක්තිමත් කිරීම/ දුබල කිරීම, දේශපාලනය මෙහෙයවීම වැනි නිල සහ නිල නොවන දේශපාලන ව්‍යූහයන් ක්‍රියාවලීන් ආදිය කෙරෙහි වූ බලපෑම. නීතිය හා සාමය; නීති පද්ධතියේ නිදහස/ දේශපාලනීකරණය; මානව හිමිකම් තත්ත්වය, කම්කරු ප්‍රමිතිය ආදිය කෙරෙහි බලපෑම. |

| සා. ගැ. බ. ක්ෂේත්‍ර | නිදර්ශන |
|---|---|
| ආර්ථික ව්‍යුහයන් සහ ක්‍රියාවලීන් | සමාන වූ සමාජ ආර්ථික ව්‍යුහයන්/ ක්‍රියාවලීන් ශක්තිමත් කිරීම හෝ දුර්වල කිරීම; යුද ආර්ථිකයන් විකෘති කිරීම/ වෙනස් කිරීම; ආර්ථික යටිතල පහසුකම්; මූලික භාණ්ඩ සැපයීම; ආයෝජන ප්‍රාග්ධනය ලැබීම; බැංකු පද්ධතිය; රැකියා බලපෑම; නිෂ්පාදන ඵලදායකත්වය; පුහුණුව; ආදායම් උත්පාදනය; වෙළඳ භාණ්ඩ හෝ සේවා නිෂ්පාදකයෝ; ආහාර අනාරක්ෂාව ආදිය කෙරෙහි වූ බලපෑම; සම්පත් විශේෂයෙන්ම අලුත් නොවන සම්පත් ප්‍රයෝජනයට ගැනීම, උත්පාදනය හෝ බෙදාහැරීම සහ ආර්ථික කල්පැවැත්ම හෝ ආහාර සුරක්ෂිතතාව සඳහා වූ භෞතික පදනම ආදිය කෙරෙහි වූ බලපෑම |
| සමාජ ප්‍රතිනිර්මාණය සහ සවිබලකරණය | ජීවන තත්ත්වය; නිර්මාණාත්මක සමාජ සන්නිවේදනය (උදා: ඉවසීම, එක්කර ගැනීම සහ සහභාගීත්ව ප්‍රතිපත්ති ප්‍රවර්ධනය කරන්නා වූ ඒවා; අවතැන් වූ ජනතාවට සෞඛ්‍ය ආරක්ෂාව හා සමාජ සේවාවල ප්‍රමාණවත් බව; ඵලප්‍රයෝජනවල නොගැලපීම; විශ්වාසය/ අවිශ්වාසය; අන්තර් කණ්ඩායම් එදිරිවාදුකම්/ සංවාදය; සන්නිවේදනය; ප්‍රවාහනය; නැවත පදිංචි කිරීම/ අවතැන්වීම; නිවාස; අධ්‍යාපනය; සාම සංස්කෘතිය වර්ධනය කිරීම. |



## 4. සා. ගැ. බ. ඇගැයීම් රාමු ඒකාබද්ධ කිරීම

ක්‍රියාකාරී සා. ගැ. බ. ඇ. ක්‍රමවේදයක් සකස් කොට ක්‍රියාවේ යෙදවීමේ වත්මන් වෑයමක් නම්, එක්සත් රාජධානියේ ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ දෙපාර්තමේන්තුව (DFID) වෙනුවෙන් INTRAC විසින් සකස් කරන්නකි. අද දක්වා සා. ගැ. බ.ඇ. සකස් කිරීමේ විවිධ උත්සාහයන්ගෙන් කිසිවක් 'ආධාර දෙන්නන්ගේ ප්‍රතිපත්ති ලෙස ඒකාබද්ධ කළ හැකි රාමු සහ මෙවලම්' බවට පත් කිරීමේදී එතරම් සාර්ථක නොවීය යන කාරණය සැලකිල්ලට ගෙන, 'වඩාත් ක්‍රමානුකූල ආකාරයකට ගැටුම් අවම කිරීමට සහ සාමය ප්‍රවර්ධනය කිරීමට ප්‍රතිපත්ති සම්පාදකයන්ට සහ වෘත්තිකයන්ට සහය විය හැකි දක්ෂ සැලසුමක් සහ කළමනාකරණයක්' ඉදිරිපත් කිරීමට INTRAC ව්‍යාපෘතිය ඉදිරිපත් වෙයි (INTRAC 1999,6). කලින් ඉදිරිපත් කෙරුණු DFID සම්මේලන පත්‍රිකාවක් (Warner 1999) පදනම් කර ගනිමින් එය සමස්ත 'ගැටුම් ඇගැයීම් ක්‍රමවේදයක' එකිනෙකට වෙනස් වූ සංරචක තුනක් හඳුනා ගනී. ඒවා නම්: උපායික ගැටුම් ඇගැයීම් (SCA), ගැටුම් බලපෑම් ඇගැයීම (CIA), සහ සාමය ගොඩනැගීමේ රාමුවක් යන්නයි.

පළමු සංරචක වන උපායික ගැටුම් ඇගැයීම, ගැටුම් පරිසරයක් පිළිබඳ විශ්ලේෂණයක් ලබාදෙන ආකාරයට සැලසුම් කොට ඇති අතර, එය කලාපීය හෝ රටවල් මට්ටමෙන් ක්‍රියාත්මක කළ හැකිය. බුෂ්ගේ පූර්ව ව්‍යාපෘති ඇගැයීම සහ විස්තරාත්මක විශ්ලේෂණ පදනම සඳහා වූ OECD/ DAC

යෝජනාව මෙන්, එය නිශ්චිත තත්ත්වයන් යටතේ ගැටුම් ක්‍රියාකාරීත්වයක් පිළිබඳ සන්දර්භ විශ්ලේෂණයක් ද, එවැනි පරිසරයක සංවර්ධන සහ මානුෂීය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා බැඳුණු අවදානම් තක්සේරුවක් ද, සාමය ගොඩනැගීමේ විශේෂිත අවස්ථාවක් පිළිබඳ ඇගැයීමක් ද ඉදිරිපත් කරයි.

දෙවැනි සංරචකය වන ගැටුම් බලපෑම් ඇගැයීම ව්‍යාපෘති පරික්ෂාව, තක්සේරුව, අධීක්ෂණය සහ ඇගැයීම යනාදියේ නිරත කාර්යාල නිලධාරීන් සඳහා වූ මෙවලමක් වශයෙන් ඉදිරිපත් කෙරේ. මෙම දෙවැනි ස්තරය විශේෂයෙන්ම ව්‍යාපෘති මට්ටම කෙරෙහි අවධානය යොමු කරන අතර, ගැටුම් පිළිබඳ අවදානම ලිහිල් කිරීමටත්, සාමය ගොඩනැගීමේ අවස්ථාවන්ට උපකාර කිරීමටත් ඒවාට ඇති හැකියාව වඩා හොඳින් තක්සේරු කිරීමටත් පදනමක් සකස් කරයි. එවැනි මෙවලමක් ගැටුමට ඔරොත්තු දීමේ ව්‍යාපෘතිවල හැකියාව (වෘත්තිය කෙරෙහි ගැටුමේ බලපෑම අවම කිරීම), අනතුරු අවම කිරීම (ගැටුම කෙරෙහි ව්‍යාපෘතියේ බලපෑම) සහ ප්‍රතිලාභ උපරිමකරණය (ගැටුම් වැළැක්වීම සහ සාමය ගොඩනැගීම සඳහා ප්‍රස්තා වැඩි කිරීම) සඳහා ඉඩ සලසයි. මේ අනුව උපායික ගැටුම් ඇගයුම් (SCA) මඟින් සැපයෙන තොරතුරු පදනම් කොටගෙන ඇගයුම් කරුවනට මූලික ව්‍යාපෘති තක්සේරු කළ හැකි අතර යම්හෙයකින් ප්‍රස්ථාවන් හෝ අවධානම් සහගත තත්වයන් අධික යැයි පෙනී යන්නේ නම් වඩාත් විස්තරාත්මක වූ ගැටුම් බලපෑම් ඇගයුමක් කළ හැකිය.

තෙවැනි සංරචකය වන්නේ සාමය ගොඩනැගුමේ රාමුවයි.මෙය සාමය ගොඩනැගුම කෙරෙහි විශේෂිත හා කැපවීමකින් යුත් අවධානයක් සහිතව ව්‍යාපෘති ඇගැයීම, අධීක්ෂණය හා තක්සේරු කිරීම සඳහා යොදා ගැනේ. විස්තරාත්මක ගැ. බ. අ. මත එය ගොඩනැගුවද, බලපෑම් ඇගැයීම සඳහා යොදාගත හැකි දර්ශක පිළියෙල කිරීමේ පදනමක් වශයෙන් හවුල්කරුවන්ගේ හැඟීම් ද ඉන් පරික්ෂා කළ හැකිය. දෙවැනි සහ තුන්වැනි ස්තරය අතර, වෙනස වන්නේ මුල් 'අවදානම් අවම කිරීම' කෙරෙහි අවධානය යොමු කිරීමත්, අනෙක අවස්ථා ප්‍රයෝජනයට ගැනීමත්ය.

මෙම එකිනෙකට වෙනස් ක්‍රමවේද තුනම යොදා ගත හැකි නිශ්චිත අන්තර්ගතය, ප්‍රභේද හෝ දර්ශක කල්තබා නිශ්චය කිරීමට උත්සාහ කරනවාට වඩා, නියාමක සිද්ධි අධ්‍යයන හතරෙහි නිරත විශේෂඥ උපදේශකයින් කරන්නා සේ වැඩ කරන අතර, මේවා පිළියෙල කර ගැනීමට INTRAC ව්‍යාපෘතිය උත්සාහ කරයි. පොදු රාමු වෙනුවට නිශ්චිත සන්දර්භ පිළිබඳ ප්‍රශ්නය වඩා හොඳින් විමසා බැලීම පිණිස, විශ්ලේෂණය සඳහා විවිධ වූ ගැටුම් තත්ත්වයන් හතරක් තෝරා ගැණිනි. ඒවා නම්; පශ්චාත් සෝවියට් ඇනහිටීම/ සංක්‍රාන්තිය, විවෘත සහ ඇවිළ යන ගැටුම; ඇවිළ යන එහෙත් පුළුල් නොවූ විවෘත ගැටුම; සහ ප්‍රච්ජන්න හෝ ඇවිළ යාමට ආසන්න ගැටුම ආදියයි.

අද වන විට ප්‍රත්‍යෙක අධ්‍යයන හතරකින් තුනක් පමණක් අවසන් කොට ඇති හෙයින් ඒ පිළිබඳ දැනුම හෝ නිගමනය තවදුරටත් මූලික එකක් සේ සැලකිය යුතුය. එසේ වුවද, මෙතෙක් ලැබුණු ප්‍රතිඵලවල යම් යම් වැදගත් ලක්ෂණ ගෙන හැර දැක්වීමට නියත වශයෙන්ම පුළුවන.

මෙයින් පළමු වැන්න වන්නේ මෙම ඇගැයීම්වල ඉතාමත් වැදගත්ම දායකත්වයක් උ. ගැ. අ. (SCA) ආකාරයෙන් ලැබිය හැකිය යන අවබෝධයයි. මෙය ආධාර දෙන රටේ ප්‍රතිපත්තිය දේශපාලන ක්‍රියාකාරීත්වයට වඩාත් සංවේදී බවක් ඇති කරන අතර, අඛණ්ඩ පදනමකින් කරගෙන යාමේ දී ඊට අනුකූල වන අයුරින් වැඩසටහන් සකස් කරන්නට ඉඩ හරිනු ඇත.

දෙවනුව, ඇත්ත වශයෙන්ම ගැටුම් තත්ත්වයක වෙනස් වූ අංශ තුළ වූ ගතිකත්වය හඳුනාගෙන විශ්ලේෂණය කිරීමට හැකිවීම වැදගත් වන අතර, *ඒවා අතර අන්තර් ගතිකත්වය* විශ්ලේෂණය කිරීම ද එතරම් ම වැදගත්ය. මෝල්ඩෝවාව පිළිබඳ සිය වාර්තාවෙන් වුඩ්වර්ඩ් දක්වන පරිදි, "විවිධ වූ ආංශික ක්ෂේත්‍රවල අන්තර් ක්‍රියාකාරී ප්‍රතිඵල විශ්ලේෂණය කිරීම වැඩියෙන්ම දුෂ්කර වුවද, ඒවා ගැටුම් බලපෑම් ඇගැයීම් ක්‍රමවේදයකින් ලැබිය හැකි අග්‍රගණ්‍ය දායකත්වයයි" (Woodward 2000,25). මීට සම්බන්ධ ව පවතින්නේ විවිධ මැදිහත්වීම්වල සමුච්චිත බලපෑම් සම්බන්ධයෙන් අවදියෙන් සිටීමේ අවශ්‍යතාවයි.

තුන්වැනිව, උ. ගැ. අ. (SCA) අධාර වැඩසටහනට ආධාරකයක් වන විවිධ උපකල්පන පැහැදිලි කිරීම අවශ්‍ය වේ: ගැටුම සහ ගැටුම විසඳීම සම්බන්ධයෙන් එය කුමන ප්‍රවේශයක් ගන්නේ ද යන්න සහ කුමන ප්‍රතිඵල බලාපොරොත්තු වන්නේද යන්න පැහැදිලි විය යුතුය. මෙය ඉහතින් දැක්වූ පරිදි ප්‍රතිපත්තිමය අගැයීම් සඳහා වූ OECD/ DAC යෝජනාවලට සමානකමක් දක්වන අතර පාදක උපකල්පන, සැබෑ වැඩසටහන, අපේක්ෂිත ප්‍රතිඵල සහ සැබෑ ප්‍රතිඵල අතර, ඇති විය හැකි ප්‍රතිවිරෝධතා ඵලදායී ලෙස අනාවරණය කරනු ඇත.

සිව්වැන්න *සන්දර්භයේ* වැදගත්කමයි. විශ්වීය මෙවලම් භාවිත කිරීමට පහසු විය හැකි වුවත්, ඒවා නිශ්චිත තත්වයක සංකීර්ණභාවය ග්‍රහණය කර ගැනීමට නියත වශයෙන්ම අසමත්වන නිසා, ඒවායේ වලංගුභාවය සීමිතය. ගුඩ් හැන්ඩ් සඳහන් කරන පරිදි "අභියෝගය වන්නේ අතිශයින්ම පොදු වන්නා වූ 'සුදානම් කොට ඇති' මෙවලම් සහ අතිශයින්ම විශේෂිත වූ හා සන්සන්දනය දුෂ්කර කරන්නා වූ 'තැනේ හැටියට ඇණේ' මෙවලම් අතර, තුලිතභාවයක් ඇති කර ගැනීමයි" (Good hand 2000, 9).



පස්වැනිව, ගැටුම් බලපෑම් ඇගැයීම සෑමවිටම අගැයීම් කණ්ඩායම, දේශීය ඔට්ටුකරුවන්, ක්‍රියාත්මත කරන ආයතන සහ ආධාර දෙන්නන් අතර වන *සංවාදයක* නිමැවුමක් විය යුතුය. ඵලදායී ඇගැයීම් ගන්නේ ක්‍රියාවලි නැඹුරු සහිත, ඉගෙන ගැනීමේ ප්‍රවේශයකි. ඇගැයීම්කරුවන් ස්ථාවර ඇගැයීමේ සහ ඇගැයීම් ක්‍රමවේදයන්ගේ නිල ස්වභාවය නැති කර ගැනීමට බලාපොරොත්තු වන්නේ එවැනි සහභාගිත්ව ක්‍රමයක් මගිනි.

සයවැන්න නිශ්චිත බලපෑම් ඇගැයීමේ සම්භාවිතාව පිළිබඳව සැලකිලිමත් වීමේ අවශ්‍යතාවයි. බොහෝ දුරට සා. ගැ. බ. අ. කටයුතු කරන්නේ පොදු දිශානතිය සහ වෙනස්වීමේ සමස්ත රටාව හඳුනාගනිමින්, *අනුමාන තත්ත්වයන්* සම්බන්ධයෙනි.

එසේ වුවද, INTRAC ප්‍රවේශයට සීමාවන් ඇති බව පැහැදිලිය. පළමුව, වැඩසටහන් හෝ ව්‍යාපෘතීන් ඇගැයීම සඳහා ප්‍රතිපත්ති මෙවලමක් හෝ නිර්ණායක පෙළක් හඳුනාගැනීමට හෝ පැහැදිලිව විස්තර කිරීමට පවා මෙතෙක් ඊට හැකි වී නැත. බුෂ් ආකෘතිය මෙන්, මතු කළ යුතු යම් යම් වර්ගයේ ප්‍රශ්නවලට සහ විමසා බැලිය යුතු කාරණාවලට අදාළව එහි ප්‍රයෝජනය භාවය සීමිතය. එසේ වන්නේ බුෂ් ඉදිරිපත් කරන නිශ්චිත බවටත් අඩු නිශ්චිත බවක් සහිතවය. මෙම දුබලතාව ක්‍රමවේදය බාහිර විශේෂඥ උපදේශකයින් සංචිතයක් අතට පත් කරමින්, එය බොහෝ දුරට ආයතනික වශයෙන් අභ්‍යන්තරීකරණය කිරීම වළක්වාලිය හැකිය.

දෙවනුව, විශ්ලේෂණයේ උපායික මට්ටම පිළිබඳ එහි අවධාරණය අවාසනාවකට මෙන් මූලික ක්‍රමවේදයේ දෙවැනි ස්තර දෙක නොදියුණු තත්ත්වයක තබයි. ඇත්ත වශයෙන්ම, ව්‍යාපෘතිය ඉදිරියට ගොස් ඇති නිසා, සාමය ගොඩනැගීමේ රාමුව ක්‍රියාත්මක කිරීමේ වෑයම අඩු වැඩි වශයෙන් අත්හැර දමනු ලැබ තිබේ. බොහෝ දුරට පූර්ණ වශයෙන් උපායික මට්ටමේ විශ්ලේෂණය මත රැඳී සිටීමේ දී ඒ හා බැඳී පවතින අනතුරු ගණනාවක් ද ඇත.

පුළුල් මට්ටමේදී එය සා. ගැ. බ. අ. (PCIA) ආධාර දෙන්නන්ගේ පැත්තෙන් 'ගැටුම් සවිඥානිකත්වයට' වඩා කිසි දෙයක් ඇති නොකරන තත්ත්වයකට පත් කළ හැකිය. බොහෝ ආධාර දෙන්නන් තුළ ගැටුම් අවබෝධයේ බරපතළ ඌනතාව අනුව මෙය නොවැදගත් ප්‍රතිඵලයක් නොවන නමුත්, එය නොනිසි ලෙස සා. ගැ. බ. අ. (PCIA) ක්‍රමවේදයන්ගේ හැකියාව සීමා කරයි. ව්‍යාපෘති මට්ටමෙන්, උපායික අගැයීම් මත රැඳී සිටීම තනි තනි ව්‍යාපෘතිවල *අවිශේෂ* අගැයීම් බවට පෙනෙන තත්ත්වයට ඇද දැමිය හැකිය. නැතහොත් අඩු තරමින් තනි තනි සාමය ගොඩනැගීමේ ව්‍යාපෘති කිහිපයකට ඉතා පහසුවෙන් දරාගත හැකි පුළුල් සමාජ ආර්ථික හෝ දේශපාලන ගතිකත්වය කෙරෙහි ඇති කෙරෙන බලපෑම් සම්බන්ධයෙන් වැඩි බලාපොරොත්තුවක් ඇති කළ හැකිය. උපායික අගැයීම මත පමණ ඉක්මවා රැඳී සිටීම නව්‍ය වූ කුඩා පරිමාණයේ සාමය ගොඩනැගීමේ ව්‍යාපෘති සඳහා සහයෝගය දීම දුෂ්කර කළ හැකිය.

තුන්වැනිව, 'අධි-සන්දර්භකරණයේ' අනතුරු ඇත. බුෂ් සහ අනෙක් අය දක්වන පරිදි INTRAC ව්‍යාපෘතිය සන්දර්භයේ වැදගත්කම අවධාරණය කිරීම නිවැරැදි වන අතර, මෙය සා. ගැ. බ. අ. (PCIA) ක්‍රමවේදයන් මුහුණදිය යුතු තවදුරටත් වැදගත් ප්‍රශ්න මාලාවක් ඉස්මතු කොට පෙන්වීමට උපකාරී වේ: එනම් විවිධ ප්‍රතිඵල ගෙන දෙන විවිධ සන්දර්භ යනු කුමක්ද? කුමක් ක්‍රියාත්මක වන්නේද? කුමක් ක්‍රියාත්මක නොවන්නේද? කොහිද? ඒ මන්ද? සිද්ධීන් හරහා සාමාන්‍යකරණයක් ඇති කර ගැනීමේ හැකියා වඩාත් ඵලදායක වන්නේත් අවබෝධය ලබාදෙන්නේත් මෙහිදීය.

අවසාන වශයෙන්, ක්‍රියාත්මක කරන ආයතනවල සහ රාජ්‍ය නොවන සංවිධානවල හෝ සැබෑ පසුබිමේ සිටින ඔට්ටුකරුවන්ගේ අවශ්‍යතාවන් නොව, INTRAC ප්‍රවේශය ආධාර දෙන්නන්ගේ අවශ්‍යතාවන් පමණක් සපුරාලන්නාවූ මෙවලමක් බවට පත්වන ආකාරය අනුව, උපායික මට්ටම පිළිබඳ එම ප්‍රවේශයේ අවධාරණයෙන් පෙන්නුම් කරන්නේ එය ආධාර දෙන්නන්ගේ බලය පතුරුවන එකක් බවට පත්විය හැකි බවයි.

## 5. සා. ගැ. බ. අ: සාම වෘත්තික දෘෂ්ටියක්

ඇගැයීම් ක්‍රමවේදය සහ නිර්ණායකය ගොඩනගා ගැනීමේ ඉතා වැදගත් සහ නව්‍ය ප්‍රයත්නයක් වන්නේ ජේ. රොත්මන් සහ මෙයර් රොස්ගේ මෙහෙයවීමෙන් ක්‍රියාත්මක වන ක්‍රියාන්විත පර්යේෂණ ප්‍රාරම්භක (ARIA) ව්‍යාපෘතියයි (Ross and Rothman 1999). මෙම ව්‍යාපෘතියේ ඇති විශේෂ වැදගත්කම වන්නේ එහි කුඩා පරිමාණ ගැටුම් විසඳීමේ සහ සාමය ගොඩනැගීමේ ක්‍රියාමාර්ගයන්ය. මෙය ARIA ව්‍යායාමය වෙනත් බොහෝ PCIA ව්‍යායාමයන්ගෙන් සැලකිය යුතු තරමින් වෙනස් කොට දක්වයි. මන්ද යත්, දෙවැන්න සාමාන්‍යයෙන් සංවර්ධන හෝ මානුෂීය වැඩසටහන්වල පෙළඹෙන අතර, වෘත්තික

දෘෂ්ටියෙන් එසේ කරනවාට වඩා නිතරම ආධාර දෙන්නන්ගේ දෘෂ්ටියෙන් එසේ කරන බැවිනි. ARIA හි නවතාව වන්නේ එය 'ක්‍රියාන්විත ඇගැයීම් ක්‍රමවේදය' විශේෂයෙන්ම භාවිත කිරීමයි.

ARIA ව්‍යාපෘතියේ අරමුණ වන්නේ 'ගැටුම් විසඳීමේ ක්‍රියාමාර්ග ඇගැයීම සඳහා සන්දර්භමය වශයෙන් සුදුසු විධික්‍රම' සකස් කිරීමයි (Rothman 1998, 119). මෙම ප්‍රවේශයන්හට ගැටුම් විසඳීමේ ආදර්ශමත් වටිනාකම් සහ පරමාර්ථවලට අනුකූල වන සහ සාධක වන නව ක්‍රමවේද අවශ්‍ය වේ යැයි රොත්මන් තර්ක කරයි. අගැයීම් ක්‍රියාවලීන් සහ ගැටුම් විසඳුම් අතර භාවිතාවන් අනන්තර සම්බන්ධයක් ගොඩනැගීමට ව්‍යාපෘතිය උත්සාහ කරයි. එ මගින් පළමුවැන්න දෙවැන්න මත බැහැරින් පැටවූවක් ලෙස නොපෙනේ. ඒ වෙනුවට එය තෙවැනි පාර්ශවයන්ට සිය අරමුණු, ක්‍රියාමාර්ග සහ ප්‍රතිඵල පැහැදිලි කර ගැනීමට උපකාර වෙමින්, ඕනෑම මැදිහත්වීමක අඛණ්ඩ කොටසක් බවට පත්වෙයි (Ross and Rothman 1999). බරක් හෝ පැටවීමක් වීමට වඩා ඇගැයීම නවතාවයේ සහ නිර්මාණශීලීත්වයේ මූලාශ්‍රයක් ලෙස සැලකිය යුතුය (Ross and Rothman 1999).

ARIA ව්‍යාපෘතිය සඳහා වූ පෙළඹවීම ආවේ ඇගැයීම සම්බන්ධයෙන් පවත්නා ප්‍රවේශයන් සහ සංයුක්ත ක්‍රියාමාර්ග මාලාවකට සම්බන්ධ වූ විශේෂිත ව්‍යාපෘති ඉලක්ක පිළිබඳව පැහැදිලි කිරීමට බොහෝ ගැටුම් විසඳීමේ ව්‍යාපෘතීන්ට නොහැකිවීම යන කාරණා දෙක සම්බන්ධයෙන් වර්ධනය වන කලකිරීමේ හැඟීම වෙතිනි. නිතරම පාහේ ව්‍යාපෘති ඉලක්ක සකස් කෙරෙන්නේ අගැයීම සම්බන්ධයෙන් සලකා බලන කල එය අර්ථ විරහිත බවට පත් කරන (සාමය ප්‍රවර්ධනය කරන්නාක් මෙන්) අපැහැදිලි සහ පණ්ඩිතමානී ආකාරයෙනි. ඊට අමතරව, කුමන තත්ත්වයක් යටතේ කුමන වර්ගයේ ගැටලු විසඳීමේ ක්‍රියාමාර්ග හා ව්‍යාපෘතීන් සාර්ථක වූයේ දැයි වටහා ගැනීමට දරන ඕනෑම ප්‍රයත්නයක් තවදුරටත් අවුල් කරමින්, ව්‍යාපෘති ඉලක්ක වෙතට පැහැදිලිව යොමු නොකරන ලද ක්‍රියාමාර්ග අනුගමනය කිරීමෙන් ව්‍යාපෘති අවසාන වේ. මැදිහත්කරුවන් සහ ඔට්ටුකරුවන් ගැටුම් විසඳීමේ ක්‍රියාමාර්ගයන්හි සිය මැදිහත්වීමට බලපාන ඉලක්ක තනි තනිව සහ අන්තර්-සම්බන්ධිත අයුරින් පැහැදිලි ව හා හොඳින් විස්තර කරන තරමට ඔවුන් වඩාත් පහසුවෙන් සාර්ථකත්වය තේරුම් ගෙන එය අත්පත් කරගනු ඇත.



ARIA ක්‍රියාවලිය අදියර තුනකින් සමන්විත වේ: මේවා පදනමක් දමා ගැනීම; මැදිහත් වීම් සඳහා ගිවිස ගැනීම; සහ සම්පාදිත යොදාගත් නිර්ණායකයන් පැහැදිලි කිරීමයි. මේවා වෙන් වෙන්ව පවත්නා වූද, අනුක්‍රමික වූද ඒවා නොව ව්‍යාපෘතිය පුරා එකපිට යන්නාවූද පුනරුක්ත වන්නා වූ ද නොකඩවා සිදුවන්නා වූද ඒවාය.

**මින් පළමු ස්තරය** - පදනමක් දමා ගැනීම - පහත සඳහන් ප්‍රශ්නවලට විසඳුම් සොයයි.

- ව්‍යාපෘති ඉලක්ක මොනවාද?
- ඒවා අදාළ වන්නේ කා හටද?, ඒ මන්ද?
- ඒවා සාක්ෂාත් කර ගන්නේ කෙසේද?

මෙහි දී අරමුණ වන්නේ ඉලක්ක පැහැදිලි කිරීමේ ක්‍රියාවලීන් හැකිතාක් විශද කිරීමයි. මෙය ඕනෑම නිශ්චිත මැදිහත්වීමක් පිළිබඳව දැනුම් දෙන ඉලක්ක සහ පරමාර්ථවල විවිධත්වතා පරාසය පෙනෙන්නට සලස්වනු ඇත. මෙම ප්‍රශ්න ඔට්ටුකාර ප්‍රතිලාභීන්ට සාපේක්ෂ ව මෙන්ම

ක්‍රියාත්මක කිරීමේ සංවිධානවලට සාපේක්ෂව ද ආධාර දෙන්නෙකු වෙත තිබිය හැකි විවිධ න්‍යාය පත්‍ර සහ අරමුණු පැහැදිලි කිරීමට උපකාරී වේ.

**දෙවැනි ස්තරය** - මැදිහත්වීම පිළිබඳව ගිවිස ගැන්ම - නොයෙක් ව්‍යාපෘති ඉලක්ක පෙරළා විවධ සම්භාරක ඔට්ටුකරුවන් වෙත ඉදිරිපත් කිරීම හා අදාළ වෙයි. මෙය ඒකරාශීවීම, වෙනස්කම් සහ ආතතීන් පිළිබඳ ලක්ෂ්‍යයන් විවිධ හවුල්කරුවන් විසින් ග්‍රහණය කරගනු ලැබීමට, විස්තර කරනු ලැබීමට, පූර්ණ වශයෙන් සන්නිවේදනය කරනු ලැබීමට සහ අවබෝධ කරගනු ලැබීමට ඉඩ සලසයි. මෙහි අරමුණ වන්නේ කාලයත් සමග කරන වෙනස්කම් සැලසුම් කොට සාකච්ඡා සඳහා ලේඛනගත කළ හැකි වන අයුරින් සහභාගි වන්නන් ව්‍යාපෘතියේ ප්‍රකාශිත අරමුණු සම්බන්ධයෙන් ප්‍රතිචාර දැක්වීමට සැලැස්වීම සහ ඒවා සම්බන්ධයෙන් පූර්ණ වශයෙන් දැනුවත් කිරීම මෙන්ම ව්‍යාපෘතිවල පදනමක් ඔවුනට ලබාදීමයි.

**තුන්වැනි ස්තරය** - සම්පාදිත නිර්ණායකයන් විස්තර කිරීම යනු සාර්ථකත්වය සඳහා සන්දර්භමය නිර්ණායකයන් ඉදිරිපත් කිරීම පිණිස සැලසුම් කරන ලද ගවේෂණය හා නිරීක්ෂණය කිරීමේ ක්‍රියාවලියකි. අනතුරුව මේවා ඉදිරියට යන ව්‍යාපෘතිය නවීකරණය කිරීම සඳහා ආභ්‍යන්තරිකව යොදාගනු ලැබේ. නැතහොත් ඉලක්ක ගැළපෙන්නේද සහ ඒවා අත්කොට ගෙන තිබේද යනු තක්සේරු කිරීම සඳහා බාහිරව යොදාගනු ලැබේ. රොස්ගේ හා රොත්මන්ගේ මතය අනුව, වඩාත් සාර්ථක ව්‍යාපෘතීන් වන්නේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන සන්දර්භය තුළ වෙනස් වන ගතිකත්වයට ප්‍රතිචාර වශයෙන් කාලයක් පුරා හැඩගැසෙන සහ පරිණාමනය වන ඒවාය. එහෙත්, මේ වෙනස්කම් ක්‍රමානුකූල සහ පැහැදිලි ආකාරයකින් සිදුවන ඒවා විය යුතු අතර, මැදිහත්වීම වෙතට පමණක් විශේෂිත වූ ප්‍රවේශයක්ය යන හැඟීම තුරන් කරන්නක් විය යුතුය. 

බැන්ක්ස් සහ මිචෙල් (1997) අනුව යමින් ARIA ව්‍යාපෘතිය බලපෑම් හෝ වෙනස්කම් තක්සේරු කළ හැකි ක්ෂේත්‍ර තුනක් හඳුනා ගනී: ඒවා නම්,

- වැඩමුළුවලට සහභාගිවන්නන් තුළම ඇතිවන ඒවා;
- වැඩමුළුව වෙතින් ඍජුව ඇතිවන ඒවා; සහ
- අදාළ පාර්ශවයන්ගේ චර්යාව සහ සම්බන්ධතා තුළ දැකගත හැකි ඒවාය.

අනතුරුව මේ තුන අභ්‍යන්තර සහ බාහිර නිර්ණායකයන් අතර වෙනස සමග බද්ධ කෙරේ. අභ්‍යන්තර නිර්ණායකය ව්‍යාපෘතිය එහි නිරත ජනතාවට හෝ කණ්ඩායම්වලට කරන ඍජු බලපෑමට සම්බන්ධය. බාහිර නිර්ණායක මෙම නිශ්චිත ඍජු බලපෑම් පුළුල් ගැටුම් ගතිකත්වය සමග බද්ධ කරයි. කිසිම ගැටුම් නිරාකරණ ප්‍රාරම්භකයක් (මේවා නිතරම පාහේ ස්වභාවයෙන් කුඩා පරිමාණයේ ඒවාය) තනිව ගැටුමක් පූර්ණ වශයෙන් නිරාකරණය නොකරන බව රොත්මන් සහ රොස් කියති. එසේ වුවද, ඕනෑම ව්‍යාපෘතියක් තමන්ගේම ක්‍රියාමාර්ග කෙරෙහි හෝ ඒකාබද්ධව සමුච්චිත වශයෙන් අනෙකුත් ක්‍රියාමාර්ග කෙරෙහි හෝ දක්වන බලපෑම අනුව පරික්ෂා කළ හැකි යයි ඔවුහු තර්ක කරති.

සා. ගැ. බ. අ. (PCIA) සකස් කිරීමේදී බෙහෙවින් දක්නා ලැබෙන පරිදි , මෙහි ඇති දුෂ්කරතාව නම් ඇගැයීම් සඳහා සුදුසු නිර්ණායක හෝ ප්‍රමිතීන් සොයා ගැනීමයි. රොස් සහ රොත්මන්

පෙන්වා දෙන පරිදි, ARIA ක්‍රියාත්මක කෙරෙන කිසිම ව්‍යාපෘතියක් මෙතෙක් "ව්‍යාපෘතියක සාර්ථකත්වය ඇගැයීම සඳහා පැහැදිලි ප්‍රමිතීන් ඉදිරිපත් කරන" තත්ත්වයට වැඩි දියුණු වී නැත (Ross and Rothman 1999). එහෙත් පහසුකම් සලසන ලද ප්‍රශ්න විසඳීමේ වැඩමුළු මගින් නිදර්ශනාත්මකව පෙන්වන ලද නිශ්චිත වර්ගයන්හි මැදිහත්වීම්වල නිශ්චිත ස්වභාවය සමග බද්ධ වූ අනුමානිත නිර්ණායකයන්හි ස්වභාවය අවබෝධ කරගැනීම දුෂ්කර නොවනු ඇත (වගුව බලන්න).

**කොටුව 3**
**පහසුකම් සලසන ලද ප්‍රශ්න විසඳීමේ වැඩමුළු සඳහා ආසන්න ඇගැයීම් නිර්ණායකයන් වැඩමුළුවට ඉදිරියට යා හැකි ප්‍රමාණය**

1. අන්තර්-ක්‍රියාකාරී ගැටුම් විශ්ලේෂණය වර්ධනය කිරීම;
2. පාර්ශ්ව අතර සබඳතාව වර්ධනය;
3. පාර්ශ්ව අතර වර්ධිත සන්නිවේදන දිරිමත් කිරීම;
4. අධ්‍යාපනික කාර්යභාරයක් ඉටු කිරීම/ අදහස් සංකල්ප, ක්‍රියාවලීන් හුවමාරුව;
5. පෙර-ගිවිසුම් කාර්යභාරයක් ඉටු කිරීම;
6. සමථය සඳහා කැමැත්ත වර්ධනය කිරීම;
7. ගිවිසුම් ක්‍රියාවලියේ දී සහායවීම;
8. ගිවිසුම් එකඟතා ක්‍රියාත්මක කිරීමට සහාය වීම;

(Source: Hoffman 1995, 16-17)



කෙසේ වුවද බුෂ් සහ INTRAC විසින් ඉදිරිපත් කරන ලද ක්‍රමවේදයන්හි දී මෙන්, ARIA ව්‍යාපෘතිය ද මූලික හෝ නිර්දේශාත්මක නිර්ණායක ඉදිරිපත් කිරීමේදී පරීක්ෂාකාරීය. ඒ වෙනුවට එයින් තර්ක කරන්නේ මේවා මැදිහත්වීම සඳහා නිශ්චිත විය යුතු බව හා, ව්‍යාපෘතියට සහභාගිවන්නන් වෙතින් මේවා හොඳින් උකහා ගනු ලබන බවයි. එවැනි ප්‍රවේශයක් වඩාත් විස්තරාත්මක, සියුම් සහ යථාර්ථවාදී නිර්ණායකයන් ඉදිරිපත් කරනු මෙන්ම ව්‍යාපෘතියක නිරත සියලු දෙනා තුළ කැපවීමක් ඇති කරන බවද ඔවුහු තර්ක කරති.

ක්‍රියාත්මක වන මැදිහත්වීමේ වර්ගය අනුව නිර්ණායකයන් ගළපා ගැනීම ද අවශ්‍ය වේ: පුහුණු හෝ කුසලතා වර්ධන වැඩමුළු සඳහා වූ නිර්ණායකයක පහසුකම් සලසන ලද ප්‍රශ්න විසඳීමේ වැඩමුළු සඳහා වූ නිර්ණායකයන්ට වඩා වෙනස්ය. එහෙත්, සිය සාමූහික පර්යේෂණ ප්‍රයත්න සහ කරගෙන යමින් සිටින ප්‍රත්‍යෙක අධ්‍යයන මගින් ආලෝකමත් වූ ඥානය අනුව කටයුතු කරමින් රොස් සහ රොත්මන් ජාත්‍යන්තර හෝ වාර්ගික ගැටුම් විසඳීම සඳහා වූ සවිස්තරාත්මක ප්‍රමිතීන් හඳුනාගෙන ඇත (කොටුව 4 බලන්න). ඊට අමතරව, නිශ්චිත ගැටුම් සහ මැදිහත්වීම් වර්ගවලදී ඉල්ලා සිටිනු ලබන අරමුණු වර්ගවල අනභූ පදනමේ ආකෘතියක් ඉදිරිපත් කිරීමේ බලාපොරොත්තුවේ දී ද ඔවුහු සුබවාදීව සිතති (Ross and Rothman 1999, 250).

## කොටුව 4 :
## ගැටුම් නිරාකරණ ව්‍යාපෘතින් සඳහා ARIA හි විස්තර කෙරෙන ප්‍රමිතීන් :

**දීර්ඝ කාලීන ප්‍රතිඵල ඉලක්ක :**

1. ආයතනගත කිරීම : දේශීය හැකියාවන් වර්ධනය කරන්න, වැඩ ස්ථායීකරණ සහ ගැඹුරු කරන ව්‍යූහ ස්ථාපිත කිරීම
2. නින්නාදවත් බව : විශේෂිත සූක්ෂම මට්ටමේ මැදිහත්වීම් කෙරේ බලපෑම හේතුවෙන් ඒවා පුළුල් සමාජය තුළ නින්නාද වෙයි.
3. සූචනය : ජනවාර්ගික ආතතීන්ට පිළියම් සඳහා ඇදහිය හැකි හා අනුකෘති වශයෙන් ඉදිරිපත් කළ හැකි ආදර්ශයන් තහවුරු කිරීම.

**එවැනි ඉලක්ක සපුරා ගැනීම සඳහා වූ ක්‍රම**

1. අවශ්‍යතා තක්සේරුව : ගැටලු හඳුනා ගැනීම;
2. සංවාදය : අර්ථවත්, අඛණ්ඩ, කල්පවත්නා;
3. විශ්වාසය ගොඩනැගීම : අන්‍යොන්‍ය විශ්වාසය සහ අවබෝධය;
4. බලගැන්වීම : නිර්මාණාත්මක සහ සාමකාමී වෙනසක් ඇති කිරීමට ඇති ශක්තිය හඳුනා ගැනීම;
5. හවුල්කාරීත්වය : අනෙකුත් වැඩසටහන් සමග සහයෝගයෙන් කටයුතු කිරීම;
6. නියුක්ත වීම : නිර්මාණාත්මක ගැටුම් කළමනාකරණය සඳහා ආරවුල්කරුවන් නියුක්ත කිරීම;
7. දේශීයකරණය : දේශීය ගැටුම් කළමනාකරණය් නායකයින් හඳුනාගැනීම;
8. උත්ප්‍රේරණය : ආරවුල් කරුවන් අතර නිශ්චිත සහයෝගිතා ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම;
9. පුහුණුව : දේශීය නායකයින්ට / ක්‍රියාධරයින්ට සන්දර්භමය වශයෙන් සුදුසු සංකල්ප සහ CR කුසලතා පුහුණුව දීම;
10. ඇගැයීම : CR මැදිහත්වීම් ඇගැයීම සඳහා විශ්වසනීය වූ ද ඵලදායක වූ ද ක්‍රම සකස් කිරීම.

(මූලාශ්‍රය Ross and Rothman 1999, 251)

ARIA ව්‍යාපෘතියේ ගැටුම් කළමනාකරණය/ සාමය ගොඩනැගීම සඳහා සෘජු බලපෑමක් ඇති ව්‍යාපෘති කෙරෙහි අවධානය යොමු කිරීම, නව්‍ය වූ ක්‍රමවේදය, ගැටුම් සහ ගැටුම් නිරාකරණය පිළිබඳ න්‍යායික ව්‍යාපෘති සැලසුම් ක්‍රියාත්මක කිරීම් සහ ඇගැයීම් සමග නිශ්චිත ලෙස සම්බන්ධ කිරීමට දරන වෑයම ඇතුළුව ධනාත්මක බොහෝ දේ ඇති අතරම, එම ප්‍රවේශයේ අනිවාර්යයෙන් ම ගැටලු ද තිබේ.

මේවායින් පළමුවැන්න නම් ඉහතින් සාකච්ඡාවට භාජනය කරන ලද විවිධ වූ ප්‍රවේශයන් මුහුණදෙන ඒවායෙහි ඉදිරිපසින් ඇති එකයි. විශ්ලේෂණය පුළුල් සහ උපායික මට්ටමේ සිට ව්‍යාපෘති මට්ටමට යා යුත්තේ කෙසේදැයි ප්‍රමාණවත් පැහැදිලි කිරීමක් කරන්නට මෙම විකල්ප ප්‍රවේශයන් අසමත් වන නමුත්, ARIA ප්‍රවේශය ප්‍රතිවිරුද්ධ දිශාවට ඇති සබඳතාව පිළිබඳ පැහැදිලි කරුණු දැක්වීමක් තවමත් කර නැත.

දෙවනුව, ඉලක්ක සම්බන්ධීකරණය කෙරෙහි එහි සංයුක්ත ප්‍රවේශය කොතරම් ප්‍රශංසනීය වුවත්, එකඟ වූ ඉලක්ක කුඩාතම පොදු හරයන් ඉතිරි කර ගැනීමේ අනතුරක් ARIA හි ඇත. ඒ අනුව මෙම ඇගැයීම් ක්‍රියාවලියේ ස්වභාවය එය ආධාරකයක් වන්නට යන නිර්මාණශීලීත්වයටම බාධාවක් විය හැකිය.

තුන්වනුව, ARIA ප්‍රවේශය සන්දර්භමය සහ සංස්කෘතික සංවේදීතාව අවධාරණය කළ ද, එම ප්‍රවේශය යනු ගැටලු විසඳීමේ ක්‍රමවේදයන්ට සහ ඉලක්ක සම්බන්ධීකරණ සංස්කරණය, සහේතුකරණය සහ සංවාදය පිළිබඳ ඒකාබද්ධ අවධාරණයට එය දෙන වැදගත්කමේ ප්‍රතිඵලයකි. මේවා බටහිර නොවන සමාජයන්ට එරෙහි පුද්ගලයා සහේතුකරණය සහ සන්නිවේදනය හා සංවාදය පිළිබඳ බටහිර සංකල්ප තුළ ගැඹුරට කාවැදුණු ඒවාය.

## 6. සා. ගැ. බ. අ: සංවාද කාරණා, ප්‍රශ්න, උභතෝකෝටික සහ ඉදිරි මාර්ග



මේ සියල්ල සා. ගැ. බ. අ. ක්‍රමවේද ඉදිරිපත් කිරීමේ ප්‍රයත්න ගෙන යන්නේ කොතැනටද? ඒ පිළිබඳ සම්භාවිතාවන් ගණනාවක් ඇත.

එකක් නම් ඉහතින් සලකා බලන ලද අත්දැකීම් සියල්ල සා. ගැ. බ. අ. ක්‍රමවේදයන් ඉදිරිපත් කිරීමේ වත්මන් ප්‍රයත්නයන් ක්‍රමයෙන් බිමට කඩා වැටෙන බව පෙන්නුම් කරන්නේය යන මතයයි. ප්‍රයත්නයන්ගේ සංඛ්‍යාව, ඒවා මුහුණ දුන් විවිධ දුෂ්කරතා සහ ඉටු නොකළ පොරොන්දු යනාදිය මෙතෙක් අසාර්ථක වූ විවිධ ගැටුම් පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධති පිළිබඳ වූ ඉහළ බලාපොරොත්තුවලට අත් වූ ඉරණමට සිත් කාවදින අයුරින් සමානය.

පූර්ව අනතුරු ඇඟවීමේ ප්‍රයත්නයන්හිදී මෙන්ම සා. ගැ. බ. අ. හිදී ද එය ගැටුම් තත්ත්වයන්ට ඵලදායී ලෙස ප්‍රතිචාර දක්විය යුතු, ජාත්‍යන්තර ප්‍රජාවේ සිටින ඕනෑම වෘත්තිකයකුට සැබවින්ම වැදගත් මෙවලමක් විය යුතුය යන්න පැහැදිලිය. සංකල්පමය මට්ටමේදී අඩු තරමින් පුළුල් අන්දමට හෝ එවැනි ප්‍රවේශයක් අත්කරගත යුත්තේ කුමක් ද යන්න පිළිබඳව පොදු එකඟතාවක් තිබිය හැකිය. එසේ වුවද පූර්ව අනතුරු ඇඟවීමේදී මෙන්ම, මෙම වටිනා අරමුණු ප්‍රායෝගික, භාවිත කළ හැකි මෙවලමක් බවට පරිවර්තනය කර ගැනීම මේතාක් සැබෑවක් වන්නට අසමත් වී තිබේ. න්‍යාය සහ භාවිතාව අතර පරතරය නැති කිරීම තවමත් සිදු වී නැත; සා. ගැ. බ. අ. සඳහා වූ විවිධ ප්‍රයත්න ප්‍රායෝගිකව තවමත් ඇවුරුණු මාවතකි.

ඒ වෙනුවට ඉහත කී කරුණු පිළිබඳව වඩාත් බලාපොරොත්තු සහගතව කරුණු විමසා බැලීමකින් ප්‍රායෝගික සා. ගැ. බ.අ. ප්‍රවේශයක විස්තර පැහැදිලි කිරීමට දරන වෑයමේදී ක්‍රමයෙන් ඇති

වන ආක්‍රමණශීලී බව පෙන්නුම් කරයි. එය අංකුර ප්‍රවේශයන් සැබෑ තත්ත්වයන්ට සැබැවින්ම යොදනු ලබන සිද්ධීන් සංඛ්‍යාව වැඩිවීම අවධාරණය කරයි. එය ශ්‍රී ලංකාව පිළිබඳ බුෂ්ගේ වත්මන් කෘති වුවද, INTRAC හි ක්‍රියාත්මක නියාමක අධ්‍යයන හතර වුවද, ARIA ව්‍යාපෘතිය යටතේ ඇතුළත් කෙරෙන සාරවත් අනුභූතික ක්‍රියා පර්යේෂණයේ පරාසය වුවද, තත්ත්වය එයයි.

එසේ වුවද, සැබෑ ප්‍රායෝගික සා. ගැ. බ. අ. ප්‍රවේශයක් සකස් කිරීමේ සහ වැඩි දියුණු කිරීමේ ක්‍රියාවලියේදී, සලකා බැලිය යුතු කරුණු රාශියක් ඇත. මේවායින් සමහරක් කුඩා පරිමාණයේ සාමය ගොඩනැගීමේ ක්‍රියාධරයින් වෙනුවට බහුවිධ වරම්ලත් මැදිහත්වීම් අතර වෙනස ගෙනහැර දැක්වීම; විශ්වසනීයත්වය පිළිබඳ ප්‍රශ්නය විසඳීම (සා. ගැ. බ. අ. කවුරුන් සඳහා ද) ; බලපෑම් ඇගැයීම සඳහා නිසි කාල රාමුවක් නියම කිරීම; සහ ව්‍යාපෘති වගකිව යුත්තේ කාහටද (ආධාර දෙන්නන්ටද? ලබන්නන්ටද?) යනාදිය සඳහා වඩා හොඳ ක්‍රම සොයයි. එහෙත් තවත් කාරණා කිහිපයක් ඊටත් වඩා වැදගත්ය.

මේවායින් පළමුවැන්න නම් දර්ශක පිළිබඳ ප්‍රශ්නයයි. දෘඩි ලෙස ස්ථාවර වූ දර්ශක පද්ධතියක් ඉදිරිපත් කිරීමට දක්වන මැලිකම තේරුම්ගත හැකි, හා නිවැරැදි වන අතර, සා. ගැ. බ. අ. භාවිත කිරීම සඳහා විස්තරාත්මක, ඇගවීමක් තරම්වන දර්ශක වර්ගයක් පවා යෙදවීමේදී මෙතෙක් ලබා ඇති සීමිත සාර්ථකත්වය කණගාටුදායකය. අපගේ කැමැත්ත වන්නේ නොගැළපෙන ඇගැයීම් ක්‍රමවේද සහ නිර්ණායක වෙතින් ඉවත් වී, ලීස්තර ක්‍රමවේදය සහ ඒ හා සමාන ප්‍රවේශයන්ට ඇති බාධාවන් ඉක්මවීම නම්, විකල්ප ප්‍රවේශයන් වෙනුවෙන් ප්‍රබල ප්‍රත්‍යයකයක් ගොඩනැගීමේ කොටසක් වන්නේ ප්‍රායෝගික නිර්ණායක සහ දර්ශක පැහැදිලි කිරීමයි.



මේවා නිශ්චිත වර්ගවල මැදිහත්වීම් පිටුපස ඇති න්‍යායයන් මත මෙන්ම ප්‍රායෝගික අත්දැකීම් සහ ප්‍රත්‍යක අධ්‍යයන වෙතින් පැන නැගෙන න්‍යායයන් මත පදනම් විය හැකිය. මෙය 'මැජික් උණ්ඩ' වලට පක්ෂව තර්ක කිරීමක් නොව, පුළුල්, අහම්බෙන් සම්බන්ධ වන රටා සහ ප්‍රභේද හඳුනා ගත යුතු යැයි යෝජනා කිරීමකි. එවැනි දර්ශක නම් කිරීමට අසමත්වීමට ප්‍රතිකර්මයක් වශයෙන්, සන්දර්භය සහ විශේෂිත තත්වයන්ගේ විශේෂිතභාවයන් ඉල්ලා සිටීම හුදෙක් සුදුසු නොවන්නා සේම ප්‍රමාණවත් නොවේ.

සා. ගැ. බ. අ. වල ඇති මෙම හිඩැස පිරවීමේදී ගත හැකි එක් ඉදිරි ක්‍රියාමාර්ගයක් විය හැක්කේ මානුෂීය ක්ෂේත්‍රයේ SPHERE ව්‍යාපෘතියට සමාන ක්‍රියාමාර්ගයක් ඇති කිරීමයි. එවැනි ලියවිල්ලක් සකස් කිරීමේදී එවැනිම ආයතන, රාජ්‍ය නොවන සංවිධාන, වෘත්තිකයින්, හවුල්කරුවන් සහ ප්‍රතිලාභීන් පෙළක් යොදාගත හැකිය.

දෙවනුව, සා. ගැ. බ. අ. අනුගමනය කරන වෘත්තිකයින්, පුළුල් ප්‍රතිපත්ති මට්ටම, උපායික ජාතික මට්ටම සහ ව්‍යාපෘති මට්ටම යන ඇගැයීම්වල විවිධ වර්ග සහ මට්ටම් අතර ඇති නිසියාකාර බැඳීම් සහ අන්තර් සම්බන්ධතා පිළිබඳව වඩාත් ප්‍රවීණ අවබෝධයක් ඇති කර ගත යුතුය. ප්‍රවේශයන් පිළිබඳ ඉහත අධ්‍යයනය මගින් පෙනී යා යුතු පරිදි, ප්‍රායෝගික සා. ගැ. බ. ඇගැයීමක් පිළියෙල කිරීමට දැනට දරන නොයෙක් ප්‍රයත්න අනෙක්වා හිලව් කොට එකකට යොමු වීමේ ප්‍රවණතාවක් දක්වයි. මෙහි ඇති අනතුර නම්, විශේෂිත අවස්ථාවන්හිදී නිශ්චිත ව්‍යාපෘතින්ට කළ හැකි දේ සහ කළ නොහැකි දේ පිළිබඳ වඩාත් ප්‍රවීණ අවබෝධයක් ඇතිවීම සාර්ථක ලෙස වළකාලමින්, කාලයේ බලපෑම් සහ සම්පත්

හිඟකම විසින් අවසානයේදී වඩා පුළුල්, වඩා පොදු උපායික මට්ටමේ විශ්ලේෂණයක් මත පමණ ඉක්මවා රැඳී සිටීමට මග පෑදීමයි.

තුන්වැන්න වන්නේ සන්දර්භ, තත්ත්ව සහ වටපිටා පිළිබඳවත් මේවායේ ධනාත්මක බලපෑම් ඇතිවීමේ හැකියාව මගින් ඇති කළ හැකි ප්‍රතිඵල පිළිබඳවත් අවබෝධයක් තවදුරටත් ඇති කිරීමේ අවශ්‍යතාවයි. තවද, මෙය සන්දර්භයේ වැදගත්කම පිළිබඳ මන්ත්‍රයෙන් ඔබ්බට යාම සහ නිශ්චිත වටපිටා තත්ත්වයන් පෙළක් යටතේ ලබන නිශ්චිත අත්දැකීම් පෙළක් වෙතින් මීට වඩා පොදු කිසිවක් ලබාගත නොහැකිය යන ඇඟවීමෙන් ඔබ්බට යාමේ අවශ්‍යතාව පෙන්වා දෙයි. සන්දර්භයන්ගේ වැදගත්කමක් ඇති බව හුදෙක් පිළි ගැනීම පමණක් නොව ඒවා වැදගත් වන්නේ කෙසේද සහ මන්ද යනු අප අවබෝධ කර ගත යුතුය.

සිව්වැන්න නම්, සා. ගැ. බ. අ. හි. නොයෙක් අංශ සහ ඒවා අතර ගතික අන්තර් සබඳතාව පිළිබඳව එකඟතාවක් ඇති, සුවිනිශ්චිත හේතු දැක්වීමක් ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවයි. විවිධ අංශ අතර අන්තර් සම්බන්ධතා පිළිබඳ වඩාත් ගැඹුරු අධ්‍යයනයක්, නිශ්චිත මැදිහත්වීම්වල ධනාත්මක හා සෘණාත්මක බලපෑම් ඇගැයීම සඳහා පමණක් නොව, ව්‍යාපෘතිවල සමුච්චිත සහ උතුරා යන බලපෑම් වඩාත් හොඳින් ඇගැයීම සඳහා ද වඩාත් ප්‍රබල ක්‍රම සලසයි.

අවසාන වශයෙන්, මේ සියල්ල අනුගමනය කිරීමේ දී, සාමය ගොඩනැගීමේ ප්‍රයත්න සම්බන්ධයෙන් ප්‍රමාණානුකූල බවේ සහ නිහතමානී බවේ අවශ්‍යතාව පිළිබඳවත්, විශේෂයෙන්ම ඒවායේ මිනිය හැකි බලපෑම හා ඒවා සාර්ථක ලෙස අගැයීම සඳහා වූ අපගේ හැකියා සම්බන්ධයෙන් අප දරන මත පිළිබඳවත් ගුඩ්හෑන්ඩ්ගේ නියමයන් පිළිගැනීම වැදගත්ය.



## 7. ආශ්‍රිත ලේඛන සහ වැඩිදුර කියැවීම්

Anderson, M. 1999. *Do No Harm: How Aid Can Support Peace – or War,* Boulder, Co: Lynne Reinner Publishers.

Banks, M. and C.R. Mitchell 1997. *Handbook of Conflict Resolution: The Analytic Problem-Solving Approach*, London: Pinter.

Borton, J. et. al 1996. *The International Response to Conflict and Genocide: Lessons from the Rwanda Experience*, 5 vols, Copenhagen: Danish Ministry for Foreign Affairs.

Bush, K. 1998. *A Measure of Peace: Peace and Conflict Impact Assessment of Development Projects in Conflict Zones,* Ottawa: International Development Research Centre, (IDRC) Peacebuilding and Reconstruction Programme Initiative and The Evaluation Unit (Working Paper No.1).

Carnegie Commission on Preventing Deadly Conflict 1997. *Preventing Deadly Conflict,* New York, NY: Carnegie.

Cockell, J. 1998. "Peacebuilding and Human Security: Frameworks for International Responses to Internal Conflict," *in* P. Wallensteen, op. cit.

Danish International Development Assistance (DANIDA), *Evaluation Reports* (various), at www.evaluation.dk.

Danish International Development Assistance (DANIDA) 1996. *Logical Framework Approach: A Flexible Tool for Participatory Development*, Copenhagen: DANIDA.
Department for International Development (DFID) / Overseas Development Agency (ODA) 1997. *Office Instructions – Project Cycle Management*.
Ebata, M. 1999. *The Transition from War to Peace: Politics, Political Space and the Peace Process Industry in Mozambique, 1992-1995*, (unpublished PhD work, University of London).
European Commission 1993. *Project Cycle Management: Integrated Approach and Logical Framework*, Brussels: European Commission.
Goodhand, J. 2000. *Conflict Assessment Project: Approach and Methodology*, INTRAC for DFID.
Hoffman, M. 1995. "Defining and Evaluating Success: Facilitative Problem-Solving Workshops in an Interconnected Context," in *Paradigms: The Kent Journal of International Relations,* Vol. 9, No. 2.
INTRAC 1999. *Project Proposal for a Conflict Assessment Pilot Project,* Manchester: University of Manchester.
Lautze, S., B.D. Jones and M. Duffield 1998. *Strategic Humanitarian Coordination in the Great Lakes Region,1996-97*, New York, NY: Office for the Coordination of Humanitarian Affairs (OCHA).
Leonhardt, M. 1999. *Conflict Impact Assessment of EU Development Cooperation with ACP Countries: A Review of Literature and Practices*, London: International Alert.
Development Assistance Committee of Organisation for Economic Cooperation and Development (OECD)/ DAC 1999. *Guidance for Evaluating Humanitarian Assistance in Complex Emergencies*, Paris: OECD Publications.
PIOOM 1999. *Armed Conflicts*, Leiden: PIOOM.
Ross, M.H. 2001. "Action Evaluation in the Theory and Practice of Conflict Resolution," *in Peace and Conflict*, Vol.8, No.1, also available at www.gmu.edu/academic/pcs and at www.aepro.org/inprint.
Ross, M.H. and J. Rothman (eds.) 1999. *Theory and Practice in Ethnic Conflict Management: Theorizing Success and Failure*, London: Macmillan.
Rothman, J. 1998. "Action-Evaluation and Conflict Resolution in Theory and Practice," *Mediation Journal*, Vol.15, No.1, 119-131, also available at www.ariagroup.com.
Smilie, I. 1998. *Relief and Development: The Struggle for Synergy*, Occasional Paper No 33, Providence, RI: Watson Institute.
Wallensteen, P. (ed.) 1998. *Preventing Violent Conflicts: Past Record and Future Challenges*, Uppsala: Dept of Peace and Conflict Research, Uppsala University Report No. 48.
Warner, R. 1999. *Strategic Conflict Analysis and Conflict Impact Assessment: A DFID/ CHAD Discussion Paper*, London: DFID.
Woodward, S. 2000. *Strategic Conflict Analysis for Moldova*, INTRAC for DFID.